# අභිමානය පෙරදැරිව...

බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් කර්මාන්තකරුවන්ගේ දැනුම, කුසලතා, ආකල්ප සංවර්ධනය උදෙසා මෙම සඟරාව එළිදැක්වීමට කටයුතු කරන ලද අතර මෙමගින් පළාත තුළ ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ කර්මාන්ත නවෝත්පාදන සංස්කෘතියක් ඇතිකිරීම අරමුණු කරගෙන ඇත. මෙම සංස්කෘතිය තුළින් ව්‍යවසායකයන් දිරිමත් කිරීම හා නව ව්‍යවසායකයන් බිහිකිරීම අපේක්ෂා කරනු ලබයි.

කර්මාන්තකරුවන්ගේ ආර්ථික පසුබිම මෙන්ම සමාජීය ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට කර්මාන්ත සංවර්ධන අධිකාරිය කටයුතු කරමින් සිටින අතර ඒ සඳහා දැනුමෙන් පිරිපුන් කර්මාන්තකරුවන් බිහිකිරීමට රාජ්‍ය ආයතනයක් වශයෙන් බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අවශ්‍යව ඇත. එය ඉටුකිරීම සඳහා ගත් එක් පියවරක් ලෙස "IDA අභිමන්" සඟරාව හඳුන්වාදිය හැක.



**රෙහෙන්සිරි වරාගොඩ**
**ගරු සභාපති**
කර්මාන්ත සංවර්ධන අධිකාරිය
(බ.ප.)


## Editorial

| | |
|---|---|
| උපදේශක සංස්කාරක | රෙහෙන්සිරි වරාගොඩ<br>ප්‍රසන්න සුජිත් කුමාර |
| සංස්කාරක | සාගරිකා සඳමාලි |
| සස්කරණ සහාය | අනුක්ෂි සමරතුංග, වසන්ති ලක්ෂ්මී, ඊෂා සම්මානි, ඉෂාන් චතුරංග |
| විවිධ සහාය | කේ. සසිකරන්, චතුරි බ්‍රාහ්මණ, තරංග බමුණුසිංහ<br>මාලා සිරිවර්ධන, ජනක බාලසූරිය, බෝධන කසුන්, සීතා අයිරාංගනී |
| ඡායාරූප | ස්ටුඩියෝ සූරි / අන්තර්ජාලය ඇසුරෙන් |
| නිර්මාණ සැලසුම | අනුහස් මහවලගේ ඇඩ්වර්ටයිසිං මීඩියා |
| මුද්‍රණය | C & I ක්‍රියේෂන්ස් |

IDA අභිමන් 2019

ප්‍රකාශනය-


© **කර්මාන්ත සංවර්ධන අධිකාරිය (බ.ප.)**


අංක 4-A,1/1 සෝරත මාවත,
(විජේරාම හන්දිය)
ගංගොඩවිල, නුගේගොඩ
දුරකථනය : 011 2804500
වෙබ් අඩවිය : www.ida.wp.gov.lk

# IDA
The Place where Industrialists Born

## ඇතුළු පිටු
## INSIDE




4 ව්‍යාපාර සාර්ථකත්වයේ සැඟවුන රහස
සනත් විදානගමගේ



8 ව්‍යාපාර දියුණුව සඳහා අවශ්‍ය ව්‍යවසායක මනස
මොහාන් පල්ලියගුරු

මගේ සාර්ථකත්වයේ අත්වැල
රොෂාන් රාජේෂ් මුණවීර 12



කර්මාන්තකරුවන්ගේ මහගෙදරින් **කාන්තා ඔබට සවියක්**
සාගරිකා සඳමාලි
15





ඔබේ අවශ්‍යතාවය යන්ත්‍රෝපකරණ නම්
16 TORENTO Engineering Pvt Ltd ඒ වෙනුවෙන්මයි





ගෝලීය උෂ්ණත්වය පාලනයට **පරිසර හිතකාමී දැව කර්මාන්තය** 18
ආර්. තරංග බමුණුසිංහ



“බස්නාහිරට පායා ඇති හිරු එළිය ඔබත් දකින්න” 20
වඩුගේ සෝමසිරි ප්‍රනාන්දු



22 පිරිවැය කළමනාකරණය සහ ව්‍යාපාර අරමුණු
Lasantha Weerasinghe



34 කර්මාන්තකරුවන්ට අතහිත දීම අපගේ අපේක්ෂාවයි
IDA අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක ප්‍රසන්න සුජිත් කුමාර
Iresha Sandagiri



27 ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය මගින් ව්‍යවසායක ඔබට ලැබෙන අත්වැල
මාලා වී. තෙන්නකෝන්

24 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සේවක ගැටළුව විසඳීමට මානව සම්පත් කළමනාකරණය
Shrimal Jayathilake



32 කර්මාන්ත සංවර්ධනය හා නවෝත්පාදන මධ්‍යස්ථානය (IDIC)



40 සේයාරූ සටහන්



29 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ වියපත් දිවියට විශ්‍රාම වැටුප් රැකවරණය
ඉන්දික ජයසිංහ



42 ශ්‍රී ලංකාවේ අපනයන ක්‍රියාපටිපාටිය
Wasantha Manthripala

Business Strategies

> **උපායමාර්ග ගොඩනැගීම යනු අනාගතය පිළියම්කිරීම වැනිය**
> *- මැක්ස් මැකෙයොන්*



# ව්‍යාපාර සාර්ථකත්වයේ සැඟවුන රහස

## ව්‍යාපාර උපායමාර්ග

අද වන විට ශ්‍රී ලාංකීය ව්‍යාපාර හා කර්මාන්ත ක්‍රමයෙන් වැසී යන තත්ත්වයක් නිර්මාණය වී ඇත. ඒකියාවලින් සියයට 75කට ආසන්න ප්‍රමාණයක් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හා කර්මාන්ත විසින් සපයනු ලැබුව ද රජයේ ආයතන හා නිලධාරීන් තවමත් කර්මාන්තකරුවා හා ව්‍යාපාරිකයා දකින්නේ රටේ සංවර්ධනයේ ප්‍රමුඛ හවුල්කරුවෙකු ලෙස නොවේ. කෙසේ වෙතත් ව්‍යවසායකයා දිරිගැන්වීමේ නිසි වැඩපිළිවෙලක් එළැඹෙන තුරු සුභවාදීව බලාසිටින අතරේ තම තමන්ගේ ව්‍යාපාර කළමනාකරණ ක්‍රමවේද බලගැන්වීම කෙරෙහි ද වැඩි සැළකිල්ලක් දැක්විය යුතුය. ව්‍යාපාරයෙන් පරිබාහිර තත්ත්වය වෙනස්කිරීමට වඩා ව්‍යාපාර අභ්‍යන්තර විභවතය හඳුනාගැනීමේ මෙන්ම වෙනස් කිරීමේ වැඩි හැකියාවක් ව්‍යාපාරික ඔබ සතුය. මේ නිසාම සියලු කර්මාන්තකරුවන් හා ව්‍යාපාරිකයින් තම ව්‍යාපාර උපායමාර්ග දෙස විශේෂ අවධානයක් යොමුකළ යුතු කාලය මෙයයි.

"උපාය දන්නෝ අපායේ නොවැටෙති" යනුවෙන් අපූරු පැරණි කියමනක් අප අසා ඇත. ඉපැරණි ග්‍රීසියේ සටන්කාමී සෙන්පතියෝ "උපාය" යන වචනය යොදාගත්තේ "යුද්ධය දිනීමේ කලාව" යන තේරුම සඳහාය. ව්‍යාපාර උපායමාර්ග යනු ව්‍යවසායකයා විසින් වෙළඳපොළ පුදුමයට පත්කිරීමේ කලාව යැයි හඳුන්වන්නට හැකිය. විශාල හෝ කුඩා ව්‍යාපාරයක අපට පෙනෙන දිගුකාලීන සාර්ථකත්වයේ රහස විශිෂ්ට උපායමාර්ග ම වන්නේය. අනාගත අභියෝග හා අවදානම් ගැන දුරදිග බලා ව්‍යාවසායක ඔබ කරනු ලබන තෝරාගැනීම් අනුව ව්‍යාපාරයේ සමස්ත අනාගතය තීරණය වේ. උපායමාර්ග නොසළකන ව්‍යාපාර අනාගතය නොසළකන්නේ යැයි ලොව ප්‍රකට කියමනක් ඇත්තේ එබැවිනි.

ඔබේ ව්‍යාපාරයේ දැක්ම, මෙහෙවර හා අරමුණු සැකසීමෙන් ව්‍යාපාරයේ අනාගතය පිළිබඳ මනා අදහසක් ඔබට ලැබෙනු ඇත, ඔබ සාක්ෂාත් කරගත යුතු අනාගත ව්‍යාපාරික ජයග්‍රහණ හා ගමන් මග ඒවායින් පෙන්නුම් කරයි. එහෙත් එකී ජයග්‍රහණ වෙත ළඟා වෙන ගමන ඒ තරම් සරල එකක් නොවන බව ඔබ දනී. විවිධ ආකාරයේ ව්‍යාපාරික අභියෝග හා තර්ජන ඔබ ඉදිරියට එනු ඇත. ව්‍යාපාරය පවත්වාගෙන යාමේ බරපතල කටයුත්තේ දී ඔබට මග පෙන්වන්නේ ඔබ පිහිටුවාගත් උපායමාර්ගයි.

පහත දැක්වෙන බොහෝ තත්ත්වයන් නොසළකා ව්‍යාපාර අරඹන හා පවත්වාගෙන යන ව්‍යාපාරිකයෝ බොහෝය. එහෙත් ඒවායින් ඇතිකරන බලපෑම් හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ සෑම මසකම සියගණන් ව්‍යාපාර වැසී යයි'

- ඔබ නිපදවන භාණ්ඩ හෝ ඉදිරිපත් කරන සේවා සඳහා අලුත් ආදේශක නිරන්තරව වෙළඳපොලට එනු ඇත.

- ගැණුම්කරුවන්ගේ හෝ පාරිභෝගිකයින්ගේ කේවල් කිරීමේ හැකියාව වැඩි වීමෙන් ඔබට අභියෝගයක් වීමට ඉඩ ඇත.
- සැපයුම්කරුවන් බලවත් වීමෙන් හා ඔවුන්ගේ කේවල් කිරීමේ බලය වැඩිවීමෙන් ව්‍යාපාරයට තර්ජනයක් ඇතිවිය හැක.
- ඔබ සිටින කර්මාන්තය තුළ අලුතින් ව්‍යාපාර බිහිවීම හෝ ඇතුල්වීම වැඩිකම නිසා ඔබේ ව්‍යාපාරයට නව අභියෝග ඇතිවේ.
- තරගකරුවන්ගේ උපක්‍රමවල අද්වීතීය බව නිසා ද ඔබේ ව්‍යාපාරයට අනපේක්ෂිත අවාසි වලට මුහුණදීමට සිදුවනු ඇත.
- ජාතික හා ගෝලීය වෙළඳපොලේ ඇතිවන ප්‍රවණතා හේතුවෙන් කර්මාන්තයේ හා පාරිභෝගික ප්‍රජාවගේ අවශ්‍යතාවල බලවත් වෙනස්කම් ඇතිවේ.

## වෙළඳපොල ජයගන්නේ කෙසේ ද? යන ප්‍රශ්ණයට, ව්‍යාපාර උපායමාර්ග, පිළිතුරු ලබාදෙනු ඇත

මෙවැනි අවදානම් හමුවේ ඔබේ ව්‍යාපාරය නොවැටී පවත්වාගෙනයාම දැවැන්ත අභියෝගයක් වනු ඇත. මේ පිළිබඳව නොසිතා කටයුතු කරන බොහෝ ව්‍යාපාර ඉතා ඉක්මණින් කඩා වැටීමට ලක්වෙයි.



සුප්‍රකට කොඩැක් සමාගම, පැන් ඇම් ගුවන් සමාගම, බ්ලොක්බස්ටර් වීඩියෝ මෙන්ම ශ්‍රී ලංකාවේ දාස සමූහ ව්‍යාපාරය හා සෙලින්කෝ සමූහ ව්‍යාපාරය මීට කදිම නිදසුන් සපයයි.

ඩිජිටල් කැමරාව ලොවට හඳුන්වාදීමේ ගෞරවය කොඩැක් සමාගම සතු වුවත් ඩිජිටල් ඡායාරූපකරණ පෙරළිය හමුවේ අසරණභාවයට පත්වීමට ඔවුන්ට සිදුවිය. ඉහත කී උපායමාර්ගික ප්‍රශ්ණ නොවිමසා සිටීම හා ඒවාට පිළිතුරු ලෙස නිවැරදි උපායමාර්ග අනුගමනය නොකිරීම ඔවුන්ගේ අසාර්ථකත්වයට ප්‍රධානතම හේතුවයි. ඇමෙරිකා එක්සත් ජනපදයේ සාඩම්බරය ලෙස හැඳින්වුන පැන් ඇම් ගුවන් සමාගම අවාසනාවන්ත ලෙස කඩා වැටීමට ලක්වූයේ ද අනාගත උපායමාර්ග නිවැරදිව යොදා නොගැනීම හේතුවෙන් බැව් කළමනාකරණ විශ්ලේෂකයින්ගේ මතය වී ඇත.

ව්‍යාපාරිකයින් අතරින් කීර්තිමත් ව්‍යවසායකයින් බිහිවන්නේ මෙකී උපායමාර්ග භාවිතයේ ඔවුන් පෙන්වන නිපුණතාවය අනුවය. තමන්ට ම සුවිශේෂ වූ විශිෂ්ට ව්‍යාපාරික උපායමාර්ග නිර්මාණයේ අති දක්ෂයින් රැසක් අපට ජාත්‍යන්තර තලයේ මෙන්ම ශ්‍රී ලංකාවේ දී ද හමුවෙයි

## උපායමාර්ගික ව්‍යවසායකයා සියල්ලන් අතරේ කැපී පෙනෙන්නේය

ව්‍යාපාරික උපායමාර්ග යනු අධික ලෙස කපටි හා කෛරාටික ලෙස ව්‍යාපාර පවත්වාගෙන යාම යැයි වැරදි මතයක් ද පවතී. උපායමාර්ගය හෙවත් ඉංග්‍රීසියෙන් 'Strategy' යන වචනය 'Stratego' යන ග්‍රීක වචනයෙන් සැකසී ඇත. එහි අරුත සෙන්පතියාගේ යුධ ජයගැනීමේ කලාව යන්නයි' පරාජයෙන් බේරීමට හා සතුරා විශ්මයට පත්කරමින් ජය තහවුරු කිරීමට සෙන්පතියා අනුගමනය කරන ප්‍රායෝගික ශිල්ප ක්‍රම උපායමාර්ග නම්වෙයි' ව්‍යාපාරිකයින් අතරින් කීර්තිමත් ව්‍යවසායකයින් බිහිවන්නේ මෙකී උපායමාර්ග භාවිතයේ ඔවුන් පෙන්වන නිපුණතාවය අනුවයි' තමන්ට ම සුවිශේෂ වූ විශිෂ්ට ව්‍යාපාරික උපායමාර්ග නිර්මාණයේ අති දක්ෂයින් රැසක් අපට ජාත්‍යන්තර තලයේ මෙන්ම ශ්‍රී ලංකාවේ දී ද හමුවෙයි' ස්ටීව් ජොබ්ස්" බිල් ගේට්ස් වැනි ජාත්‍යන්තර ව්‍යවසායකයින් මෙන්ම විශිෂ්ට ජාතික ව්‍යවසායකයින් වන හින්නි අප්පුහාමි (මැලිබන්&" ප්‍රීති ජයවර්ධන ^හවුස් ඔෆ් ෆැෂන්&" ජැනට් බාලසූරිය ^ජැනට්&" ආචාර්ය කිරිවන්දෙනිය ^සණස ව්‍යාපාරය& ඊට කදිම උදාහරණ ලෙස හැඳින්විය හැක' ඔවුන්ගේ උපායමාර්ග අතිශය සුවිශේෂී බවක් පෙන්වන අතර ම තමන් සිටින කර්මාන්තය තුළ ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීමට හැකිව තිබේ'

## ව්‍යාපාර යුද්ධයේ දී ද ව්‍යවසායකයා සකසා ගන්නා ශක්මත් උපායමාර්ග ඔහුගේ සමස්ත උත්සාහයෙන් 50%ක කාර්යභාරයක් ඉටුකරයි

දිගුකාලීන සටනේ දී එබඳු උපායමාර්ග ඇත්තෝ පමණක් තම වර්ධනය රඳවාගෙන ඉදිරියට යන

අතර සෙසු ව්‍යාපාර අවාසනාවන්ත ලෙස කඩා වැටීමට ලක්වෙයි'

විශේෂයෙන් ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කඩාවැටීමට හේතුව තමන්ට සුදුසු ව්‍යාපාර උපායමාර්ග සකසා නොගැනීම හෝ වැරදි උපාය මාර්ග අනුගමනය කිරීමයි'

ඔබේ ව්‍යාපාරික උපායමාර්ග මොනවාදැයි ව්‍යාපාරිකයින්ගෙන් හා ප්‍රධාන විධායකයින්ගෙන් ඇසූකල බොහෝවිට අසන්නට ලැබෙන්නේ මෙබඳු පිළිතුරුය'

- අපි නව නිෂ්පාදන රැසක් ඉදිරිපත් කිරීමෙන් වෙළඳපොළ ජයගන්න බලාපොරොත්තු වෙනවා
- නව සන්නම්කරණ වැඩපිළිවෙලක් (Branding) සමග ඉදිරියට යාමටයි අප සැලසුම් කළේ
- අපේ භාණ්ඩවල මිල අඩු කර අළෙවිය වැඩි කරගැනීමට අප සැලසුම් කළා
- අපේ ශාඛා ජාලය පුළුල් කිරීම මගින් වෙළඳපොල කොටස වර්ධනය කරගැනීමට නියමිතයි

මේවා හොඳ ව්‍යාපාර වැඩිදියුණු කිරීමේ අදහස් වුවත් ඒ එකක්වත් නිවැරදි ව්‍යාපාර උපායමාර්ගයක් ලෙස සැළකිය නොහැක'

ජයග්‍රහණ වෙත ලඟා වෙන ගමන ඒ තරම් සරල එකක් නොවන බව ඔබ දනී. විවිධ ආකාරයේ ව්‍යාපාරික අභියෝග හා තර්ජන ඔබ ඉදිරියට එනු ඇත. ව්‍යාපාරය පවත්වාගෙන යාමේ බරපතල කටයුත්තේ දී ඔබට මග පෙන්වන්නේ ඔබ පිහිටුවාගත් උපාය මාර්ගයි.

**දිගුකාලීනව අප නොවරදවා කළයුතු දේ මෙන්ම අප නොකලයුතු දෑ මොනවාද යන්නත් උපායමාර්ග ඔබට පෙන්වාදෙනු ඇත'** -

ඔබේ ව්‍යාපාරයට ගැළපෙන උපායමාර්ග සකසා ගන්නේ කෙසේ ද? ඒ සඳහා පළමුව පහත ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම ආරම්භ කරන්න'

අප තරග කරන්නේ කුමන ආකාරයේ වෙළඳපොලක ද? එහි තරගකරුවන්ගේ විශිෂ්ටතා මොනවාද? එහි ඇති වර්තමාන හා අනාගත අවදානම් මොනවා ද? තර්ජන මොනවා ද?

එකී වෙළඳපොලේ අතිශය සාර්ථක වීමට නම් අප එකතු කළ යුතු සුවිශේෂී වටිනාකම (Unique Value) හෙවත් අපේ නිෂ්පාදන හෝ සේවාවල පැවතිය යුතු අද්විතීය බව (Uniqueness) කුමක් ද? ඊට කුමක් කළ යුතු ද?

ඔබේ නිෂ්පාදන හෝ සේවාවල මිල ගණන්වල පවතින වාසිදායක හා



අවදානම් තත්ත්වයන් මොනවා ද? එසේම ඒවායේ පිරිවැය මට්ටම් වෙනස් කිරීමක දී ඇතිවිය හැකි අවදානම් මොනවා ද? ඔබේ ව්‍යාපාරය සතු විශේෂ වාසි මොනවා ද?

කර්මාන්තය තුළ බිහිවන නව ව්‍යාපාර හා එහි සිටින සැපයුම්කරුවන්ගෙන් ඇතිවන අභියෝග හමුවේ සාර්ථක වීමට නම් අප ඇති කළ යුතු වෙනස්කම් මොනවා ද?

ඒ සියල්ල සඳහා අප සතු හැකියාවන් (Competancies) හා සම්පත් (Resources) මොනවා ද?

අනාගත අභියෝග හමුවේ ඉහත කී අද්විතීය බව රැකගන්නේ හා පවත්වාගන්නේ කෙසේ ද?

අප ඉදිරියේ ඇති විකල්ප මොනවා ද?

භාණ්ඩ මිල දෙස අවධානය යොමුකරන්න - ඔබේ ව්‍යාපාරයේ අළෙවිය හා ලාභදායීත්වය අඩු මට්ටමක පවතී නම් ඔබ නිපදවන හා අළෙවිකරණ භාණ්ඩ හා සේවාවන් වෙනස් කිරීමට හෝ විවිධාංගීකරණය කිරීමට ඔබට හැකියි. පවතින නිෂ්පාදන/සේවා පෙළ පවත්නා වෙළඳපොලේ වඩා හොඳින් අළෙවි කිරීමට හා වැඩි වැඩියෙන් අළෙවි කිරීමට අවශ්‍ය උපාය මාර්ග කෙරෙහි අවධානය යොමු කරන්න. පවතින වෙළඳපොලෙහි ගවේෂණය නොකල පාරිභෝගික භාණ්ඩ හා වෙළඳපොල අවස්ථා පැවතියත් අප ඒ කෙරෙහි විශේෂයෙන් විමසා බලන තෙක් ඒවා අපට පෙනෙන්නේ නැත. තොග අළෙවිය හා සිල්ලර අළෙවිය යන ද්විත්වයම පවත්වාගෙන යාමෙන් පවතින නිෂ්පාදන අළෙවිය වැඩිකළ හැකිය. සමහර සමාගම් ගෙන්-ගෙට අළෙවිය වැනි ක්‍රම යොදා ගන්නේ ද පවතින වෙළඳපොලේ අළෙවිය ඉහළ නැංවීමේ උපාය මාර්ගයක් ලෙසිනි.

දැනට පවත්නා වෙළඳපොලට හා අලුත් වෙළඳපොල වෙත නව

නිෂ්පාදන හා සේවා හඳුන්වා දෙන්න - නව නිපැයුම් වෙත අවධානය යොමුකිරීම හෝ නිපැයුම්වල විවිධත්වය ඇති කිරීම අවශ්‍යයෙන්ම අවධානය යොමු කළ යුතු උපායමාර්ගයකි. නව තාක්ෂණය යොදා ගැනීම හා තාක්ෂණික වැඩිදියුණු කිරීම් දෙස විශේෂයෙන් අවධානය යොමු කළ යුතුව ඇත. උදාහරණයක් ලෙස යුනිලිවර් සමාගමේ විම් සේදුම් කාරකය දෙස අවධානය යොමුකර බලන්න' විම් කුඩු, දියර හා කැට ලෙස ආකාර ගණනාවකින් හා ප්‍රමාණ දහයකින් පමණ වෙළඳපොලට ඉදිරිපත් කිරීමේ උපායමාර්ගය ඔස්සේ අලෙවියේ විශාල වෙනසක් ඇතිකර ගැනීමට ඔවුන්ට හැකියාව ලැබී ඇත' නිපදවීම වැඩිකිරීම මෙන්ම නිපදවීම සීමාකර වෙනත් සැපයුම් මූලාශ්‍රවලින් මිලට ගැනීම ද මෙහිදී සළකා බලන්න පුළුවන්. දැනට අළෙවිකරණ භාණ්ඩ හා සේවා තුල කාණ්ඩවල ඒ ඒ ආදායම් මට්ටම් විශ්ලේෂණය කර බලා නිසි උපායමාර්ගයක් නිර්මාණය කර ගැනීම සුදුසු වනු ඇත'

නව වෙළඳපොල කලාප හා වෙළඳපොල ඛණ්ඩවල අලෙවි තත්ත්වයන් ව්‍යාප්ත කරන්න - භූගෝලීය ප්‍රදේශ අනුව අළෙවි තත්ත්වය විශ්ලේෂණය කිරීමෙන් හා ඒ ඒ වෙළඳපොල ඛණ්ඩයේ ඇති වෙනස්කම් විමසා බැලුවහොත් ඔබේ ව්‍යාපාරයේ වෙළඳපොල බලය ව්‍යාප්ත කිරීමේ විකල්ප උපායමාර්ග මතුකර ගන්නට හැකි වනු ඇත. අලුත් වෙළඳපොල ඛණ්ඩ වෙත ප්‍රවේශ වීමේ ඉඩකඩ මෙහිදී විමසා බලන්න. සමහර විට භූගෝලීය වශයෙන් වෙනත් දිස්ත්‍රික්ක, පළාත් හෝ වෙනත් රටක් වෙත ප්‍රවේශ වීමේ හැකියාව කෙරෙහි අවධානය යොමු කළ විට නව අවස්ථා මතුකර ගත හැ|'මන්චී හා මැලිබන් සමාගම් විදේශ රටවල් 20කට වැඩි ගණනක තම වෙළඳ නියෝජිතයින් හඳුනාගෙන අලෙවිය ව්‍යාප්ත කර ඇත'මහා පරිමාණ නිෂ්පාදනයක් කරන සමාගමක් නම් එවැනි උපායමාර්ග වඩාත් ගැලපෙනු ඇත'




**සනත් විදාන ගමගේ**

*Consultant (Management & Personal Development)*
*Growth Concept Institute,*
*Lecture- Entrepreneurship*







# ව්‍යාපාර දියුණුව සඳහා අවශ්‍ය ව්‍යවසායක මනස

## ව්‍යවසායකයෙක් ලෙස සිතන්න

සියළු සාර්ථක අසාර්ථකභාවයන් තීරණය වන්නේ ලබා උපන් ආකාරය මත නොව මිනිසුන් සිතන පතන ආකාරය හා හැසිරෙන ආකාරය මතයි. මෙය ව්‍යාපාරික ක්ෂේත්‍රයටද පොදු වන්නේ ය. පුද්ගලයෙක් ව්‍යවසායකයින් බවට පත්වන්නේත් ඔවුන් ව්‍යවසායකයින් ලෙස සිතන නිසාය. පුද්ගලයෙක් සේවකයන් වන්නේ ඔවුන් සේවකයන් ලෙස සිතන නිසාය. ඔබ රැකියාවක් කරමින් සිටින්නකු වුවත් ව්‍යවසායකත්ව මනසක් ඇති කර ගතහොත් එම රැකියාව තුළ පවා විශාල දියුණුවක් අත් පත් කරගත හැකිය. ඔබ ව්‍යාපාරයක් දැනටමත් ආරම්භ කර ඇති අයෙක් වුවත් දිළිඳු සේවක මානසිකත්වයක් ඇති කර ගතහොත් ඉක්මනින් ඔබේ ව්‍යාපාරය අසාර්ථකත්වයට පත්වනු ඇත.

මෙම ලිපියේ අරමුණ සාර්ථක ව්‍යවසායකයෙකු (ව්‍යාපාරිකයෙකු) වීම සඳහා අවශ්‍ය මානසික සූදානම ඇතිකර ගැනීමයි.

### සිහිනයක් දකින්න

සෑම ව්‍යාපාරිකයකුටම සිය ව්‍යාපාරයේ අනාගතය පිළිබඳ සිහිනයක් තිබිය යුතුය. සිහින දකින්නන් දිනක එය යථාර්ථයක් බවට පත් කර ගනු ඇත. ඒ සඳහා අවශ්‍ය වන්නේ ක්‍රියාත්මක වීම පමණි. ක්‍රියාත්මක වී ඉටු කරගන්න සිහිනයක් තිබීම අත්‍යවශ්‍ය වේ. ලොව සියලු සාර්ථක ව්‍යාපාරිකයින් අනාගතය ගැන සුබ සිහින දැක්කෝ වෙති. ඔබ දැනටමත් ව්‍යාපාරයක් අරඹා එය යම් මට්ටමකින් සාර්ථකව කරගෙන යන්නකු වන්නට පිළිවන්, නොඑසේනම් ආරම්භ කරන්නට සිතන අයකු වන්නට පුළුවන්, නැතිනම් ඇරඹූ ව්‍යාපාරය ඉතා අපහසුවෙන් පවත්වාගෙන යන්නකු වන්නට පිළිවන්. ඒ කවර මට්ටමක ඔබ සිටියත් ඔබේ ව්‍යාපාරයේ අනාගතය පිළිබඳ ඔබට යම් දැක්මක් පැවතිය යුතු වන්නේය.

මා ඔබෙන් සරල ප්‍රශ්න කිහිපයක් විමසමි. තවත් වසර 5ක් වන විට ඔබේ ව්‍යාපාරය පවතින්නේ කවර මට්ටමකද? එහි මාසික ආදායම හා ලාභය කවර අගයක්ද? සේවක භවතුන් කොපමණ ප්‍රමාණයක් රාජකාරී කරන්නේද, ඔබේ ප්‍රධාන කාර්යාලය කවර ආකාරද? එය වෙළෙඳපොලේ කවර ස්ථාවරත්වයක් අත් කරගෙන ඇත්ද? ඔබේ පාරිභෝගිකයින් සංඛ්‍යාව දළ වශයෙන් කොපමණ වනු ඇත්ද? මාසික නිෂ්පාදනය හෝ අලෙවිය කොපමණ ප්‍රමාණයක්ද? ඔබේ වටිනාකම කොපමණද? අප විසින් මෙහි අසා ඇති ප්‍රශ්නවලින් කිහිපයකටවත් ඔබට පැහැදිලි, ස්ථාවර පිළිතුරු ක්ෂණිකව සිතට නොම එන්නේනම් එහි අදහස ඔබට අනාගතය පිළිබඳ සිහිනයක් හෝ සැලසුමක් නැති බවයි. එය ඉතා භයානක විය හැකිය. මේ මොහොතේම ඔබේ අනාගත ව්‍යාපාරික සිහිනය සකසා ගන්න.

### වෙනස් වන්න සූදානම් වන්න

ව්‍යාපාරික ලොව තරගකාරී බව ඉතා ඉහළ මට්ටමක පවතී. තරගය තුළ රැඳෙන්න වෙනස් වීම අත්‍යවශ්‍ය කාරණයකි. වෙනස් විය නොහැකි දෙය නොගැළපෙන දෙය බවට පත්වනු ඇත. එවිට පැවැත්ම ඉතා අස්ථාවර වනු ඇත. මේ නිසා සාර්ථක ව්‍යාපාරයක් ගොඩනගා පවත්වාගෙන යාමට අපේක්ෂා කරන්නකු වෙනස්වීමේ දැඩි රුචියෙන් පෙළෙන්නකු විය යුතුය. තාක්ෂණික වෙනස සමඟ වෙනස්වීම, වෙළෙඳපොල අවශ්‍යතා සමග වෙනස්වීම. පාරිභෝගික අවශ්‍යතා හඳුනාගෙන වෙනස්වීම ආදී ලෙසින් මෙම වෙනස් වීම විවිධ අංශ ඔස්සේ පැතිර යනු ඇත.

**සෑම ව්‍යාපාරිකයකුටම සිය ව්‍යාපාරයේ අනාගතය පිළිබඳ සිහිනයක් තිබිය යුතුය. සිහින දකින්නන් දිනක එය යථාර්ථයක් බවට පත්කරගනු ඇත. ඒ සඳහා අවශ්‍ය වන්නේ ක්‍රියාත්මක වීම පමණි. ක්‍රියාත්මක වී ඉටුකරගන්න සිහිනයක් තිබීම අත්‍යවශ්‍ය වේ. ලොව සියළු සාර්ථක ව්‍යාපාරිකයින් අනාගතය ගැන සුබ සිහින දැක්කෝ වෙති.**

මෙයට දශක කිහිපයකට පෙර ලොව ප්‍රබලතම ජංගම දුරකථන නිෂ්පාදන සමාගම වුයේ නොකියා සමාගම බව බොහෝ දෙනා දන්නා කාරණයකි. නමුත් ජංගම දුරකථන ක්ෂේත්‍රයේ සිදුවූ තාක්ෂණික වෙනස මනාව හඳුනාගෙන එයට ගැළපෙන ලෙස වෙනස් නොවීම නිසා එම සමාගමට අත්වූ ඉරණම මෑත යුගයේ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ කතා බහට ලක්වූ ප්‍රබල මාතෘකාවකි. එහි ප්‍රධාන නිලධාරියා හඬමින් මාධ්‍ය හමුවකදී ප්‍රකාශ කළේ "අප කිසිදු වරදක් නොකළමුත් අපට වරදක් වී ඇත "යනුවෙනි. ඔවුන් කිසිදු වරදක් නොකළත් කළ එකම වරද වෙනස් නොවීමයි.

සාර්ථක ව්‍යාපාරිකයෝ අනාගත වෙනස අද හඳුනාගෙන එයට අවශ්‍ය වෙනස්කම් මේ මොහොතේ කරන්නෝ වෙති. තාක්ෂණය වෙනස් වන විට එම තාක්ෂණය සමඟ සිය ව්‍යාපාර යාවත්කාලීන කර ගැනීම, පාරිභෝගික රුචිකත්වයන් හඳුනාගෙන එයට ගැළපෙන ලෙස අපේ නිෂ්පාදන, ව්‍යාපාරික ස්ථාන වෙනස් නොකිරීම අපට තරගය තුළ අවාසි අත් කර දෙනු ඇත. එමනිසා වෙනසට අනුගත වීම හා වෙනස් වීම ව්‍යාපාරික ලොව අත්‍යවශ්‍ය කාරණයකි.

## වෙනසක් කළ හැකි හොඳම තැන

වරක් ප්‍රවීණ දේශකයකු හා ලේඛකයකු වන රොබින් ෂර්මා ප්‍රකාශ කළේ

"අනාගත ලෝකයේ ආයතන අතර තරගය තීරණය වනුයේ අලෙවිකරණ භාණ්ඩ මත නොව සපයනු ලබන සේවා මතය" යනුවෙනි. අප භාණ්ඩ හෝ නිෂ්පාදන මත කරනු ලබන වෙනස්කම් ඉතා පහසුවෙන් හා ඉක්මණින් අනෙක් ආයතන විසින් නිෂ්පාදකයින් විසින්  අනුකරණය කරනු ඇත. එහෙත් අප අපගේ ගනුදෙනුකරුවන්ට සළකන ආකාරය අනන්‍ය වනු ඇත. මේ නිසා තරගකාරී ව්‍යාපාරික ලොව සිය පැවැත්ම ආරක්ෂා කර ගැනීම සඳහා සිය ගනුදෙනුකරුවන්ට අනන්‍ය වූ සේවයක් සැපයීම අත්‍යාවශ්‍ය කාරණයකි. ඔවුන්ට අප හැර නොයන්නට සිතෙන ලෙස සැළකීමත් හොඳ සබඳතා ගොඩනගා ගැනීමත් ව්‍යාපාරික සාර්ථකත්වය සඳහා අත්‍යාවශ්‍ය සාධකයකි. ගනුදෙනුකරුවන්ගෙන් තොර, පාරිභෝගිකයන්ගෙන් තොර ව්‍යාපාරයක් ගැන අපට සිතිය නොහැකිය.

## අවධානමක් දරන්න සූදානම් වන්න

ව්‍යවසායකයෙකු සතු ගුණාංග අතර එක් ප්‍රධාන ගුණාංගයක් වන්නේ අවධානම් දරන්නට ඇති හැකියාවයි. අවධානමක් දරන්නට සූදානම් නැති කිසිවෙකුට සාර්ථක ව්‍යාපාරිකයෙකු විය නොහැකිය.

ඉඩම් සංවර්ධනය කර විකුණන ව්‍යාපාරිකයකු මට පසුගිය දිනක මුණගැසුණි. ඔහු ඉතා සුළුවෙන් සිය ව්‍යාපාරය ආරම්භ කර ඉතා සාර්ථකව කරගෙන යන්නෙකි. ඔහු ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා ඉඩම් සොයන අවස්ථාවේ කනත්තක් අසළ ඉඩමක් ලැබුණ බවත් එය වෙනත් ඉඩම් සංවර්ධනය කර අළෙවි කරන ආයතන වලින් ප්‍රතික්ෂේප කර තිබුණේ කනත්තක් අසළ වීම නිසා අළෙවි කිරීමට අපහසු වනු ඇතැයි යන හැඟීම නිසාය. ඉඩම් හිමියාටද ඉඩම අළෙවි කරගැනීමට මෙම කනත්තේ සිද්ධිය හේතු විය. මෙම කාරණය නිසාවෙන් අප මිත්‍රයාට අදාළ ඉඩම ඉතාම අඩු මිලකට ලබාගැනීමට හැකි විය. ඔහු අවදානම දරාගෙන එයට අතගසන්නේ බොහෝ දෙනා එයට එරෙහි වූ උපදෙස් ද නොතකා, නොසළකා හරිමිනි. ඉතින් මොකද උනේ? මගේ කුතුහලය පිරි ප්‍රශ්නය විය. මුකුත් නෑ, ඉඩම සංවර්ධනය කරලා කැබලි කරලා විකුණලා සාධාරණ ලාභයක් උපාය ගත්තා. ඔහුගේ ජයග්‍රාහී පිළිතුර විය. මොකද්ද කළ වෙනස්කම ? යළි විමසුවෙමි. කනත්ත නොපෙනෙන තරමට ලස්සන තාප්පයක් දැම්මා. පාර හොඳට හැදුවා, ඉඩම ඇතුළට ගියහම කනත්ත අමතක වෙන්න ඉඩම ලස්සනට හැදුවා. ඔහු දිගට කියාගෙන යයි.

> **අනාගත ලෝකයේ ආයතන අතර තරගය තීරණය වනුයේ අලෙවිකරන භාණ්ඩ මත නොව සපයනු ලබන සේවා මතය.  අප භාණ්ඩ හෝ නිෂ්පාදන මත කරනු ලබන වෙනස්කම් ඉතා පහසුවෙන් හා ඉක්මනින් අනෙක් ආයතන විසින් නිෂ්පාදකයින් විසින්  අනුකරණය කරනු ඇත. එහෙත් අප අපගේ ගනුදෙනුකරුවන්ට සළකන ආකාරය අනන්‍ය වනු ඇත.**

අවධානම් දරන්නේ නැතිව ව්‍යාපාර සාර්ථකව කළ නොහැක. එහෙත් "ගණනය කළ අවදානමක්" දරන්නට වග බලාගත යුතුය. එය තමාට දරන්නට පුළුවන් මට්ටමේ එකක්ද විය යුතුය.

## පමණ දැන වියදම් කරන්න

මා පසුගිය දිනක ව්‍යාපාරික හමුවක දේශනයක් සදහා ආරාධනා ලැබ සහභාගි වුයෙමි. එය එම නගරයේ සාමාන්‍ය ව්‍යාපාරිකයකින්ගේ හමුවක් වූ මුත් බොහෝ ව්‍යාපාරිකයින් පැමිණ සිටියේ ඉතා මිල අධික රථවාහන වලිනි. එහෙත් ඔවුන් බොහෝ දෙනා නැගුවේ සිය ව්‍යපාර පිළිබඳ මැසිවිලිය, අපහසුතාවයන්ය, අධික වියදම් පිළිබදවය. මා එවිට සංවිධායකවරයාට ළං වී ඔවුන්ට එතරම් අපහසුතා ඇත්නම් මෙතරම් මිල අධික වාහන පාවිච්කරන්නේ කෙසේදැයි විමසු විට ඒ සියල්ල "කල් බදු සේවා" මත දුවන වාහන යැයි පැහැදිලි කර දුනි.

අප ලාච්චුවට වැටෙන සියළු මුදල් අපගේ ආදායම හෝ ලාභය ලෙස අප වරදවා වටහා ගතයුතු නැත. ඉන් වියදම් පාර්ශවයට අදාළ සියල්ල ප්‍රථමයෙන් අයින් කළ යුතුය. එය ස්ථාවර වියදම් හා විචල්‍ය වියදම් ලෙස වර්ග වන්නේය. විචල්‍ය වියදම් ලෙස සේවක පඩි නඩි. විදුලි බිල්පත, සැපයුම් කරුවන්ගේ ගෙවීම ආදී දෙය වේ. එමෙන්ම මිලදී ගත් ප්‍රාග්ධන භාණ්ඩ වල ක්ෂයවීම සඳහා තමාගේ යෝජනා සඳහා ද වෙන් කළ යුතු වන්නේ ය. ඉන් අනතුරුව ඉතිරිය සරලව අප ලාභය ලෙස දකිමු. මෙම ලාභයද සියල්ල පරිභෝජනය කර ව්‍යාපාරය සාර්ථක කර ගන්නට ලැබෙන්නේ නැත. බෞද්ධ ඉගැන්වීම වලට අනුව නම් ඉන් හරි අඩක් ව්‍යාපාරයේ දියුණුව සඳහා යළි ආයෝජනය කළ යුතුය. ඉතිරි කොටසින් අඩක් මතු ආරක්ෂාව වෙනුවෙන්ද ඉතිරිය පරිභෝජනය සඳහා ද යොදාගත හැකිය. එසේ නොකොට ලැබෙන සියල්ල ආදායම ලෙස සළකා වියදම් කරන්නට ගියහොත් හතර අතට ණයකාරයකු වනු ඇත. ව්‍යාපාරයේ දියුණුව සඳහා සිත යොමන්නට අවශ්‍ය මානසික නිදහස නැතිවී යනු ඇත. ගත් ණය ගෙවන්න තව ණය ගැනීම කර අවසානයේ ණය උගුලක පැටලෙනු ඇත. අනුන්ට පෙනෙන්නට නොව තමන්ගේ තරම දැන වියදම් රටාව සකසා ගැනීම සාර්ථකත්වයට උපකාරයක් වනු ඇත.

## හොඳ කණ්ඩායමක් ගොඩ නඟන්න

ලොව සෑම අති සාර්ථක ව්‍යාපාරිකයකුටම ඉතාම දක්ෂ කණ්ඩායමක් සිට ඇත. එවන් කණ්ඩායමකින් තොරව ව්‍යාපාර ඊළඟ මට්ටම කරා ඔසවා තැබිය නොහැකිය. සිය සිත තුළ ඇතිවන සාර්ථක ව්‍යාපාරික අදහස් මනාව ක්‍රියාවට නැංවීම සඳහා දක්ෂ විශ්වාසනීය කණ්ඩායමක් අවශ්‍යම කාරණයකි. එවන් කණ්ඩායම් ඉබේ ගොඩනැගෙන්නේ නැත. අප විසින් ගොඩ නංවා ගත යුතුය. වරක් මා සමඟ සාර්ථක ව්‍යාපාරිකයකු සඳහන් කළේ, තමා වටා සිටින අත්‍යාවශ්‍ය, ව්‍යාපාරයේ සාර්ථකත්වයට ඉතා වැදගත් සේවකයන් හට ආයතනය හැරයා නොයන්නට සිතෙන ලෙස තමා විසින් ඔවුන්ව රැකගන්නා බවයි. සාර්ථක ව්‍යාපාරිකයින් හොඳින්ම දන්නා කාරණයක් වන්නේ සාර්ථක කණ්ඩායමකින් තොරව සාර්ථකත්වය කරා යා නොහැකි බවයි.

## නිරන්තර ඉගෙනුම හා සංවර්ධනය

ලෝකය වෙනස්වන විට අප වෙනස් විය යුතුය. වෙනස්වන්න නම් අප ලෝකයට විවර විය යුතුය. "මම දැන් සියල්ල දන්නවා - තව මොනවා ඉගෙන ගන්නද? ඕන නම් මම අනෙක් අයටත් කියා දෙන්නම්" ආදී ලෙස සිතන්නට පටන් ගතහොත් අපගේ වර්ධනය නතරවීම ඇරඹෙනු ඇත. මට හමු වී ඇති සෑම සාර්ථක ව්‍යාපාරිකයකුගේම පාහේ

**ලැබෙන සියල්ල ආදායම ලෙස සලකා වියදම් කරන්නට ගියහොත් හතර අතට ණයකාරයකු වනු ඇත. ව්‍යාපාරයේ දියුණුව සඳහා සිත යොමන්නට අවශ්‍ය මානසික නිදහස නැතිවී යනු ඇත. ගත් ණය ගෙවන්න තව ණය ගැනීම කර අවසානයේ ණය උගුලක පැටලෙනු ඇත. අනුන්ට පෙනෙන්නට නොව තමන්ගේ තරම දැන වියදම් රටාව සකසා ගැනීම සාර්ථකත්වයට උපකාරයක් වනු ඇත.**

පොදු ලක්ෂණයක් වනුයේ තමාට තවත් ඉගෙන ගන්නට බොහෝ දේ ඇතැයි විශ්වාස කිරීමයි. ඔවුන් මේ නිසා යන ඕනෑම තැනක තමාට ඉගෙන ගන්නට දෙයක් සොයයි. එන අයගේ අදහස් වලට හොඳින් සවන් දෙයි. එකට වැඩ කරන්නන්ගේ අදහස් විමසයි. හොඳ පොතපත කියවයි. ව්‍යාපාරික අදහස් සංවර්ධන කරන වැඩමුළුවලට සම්බන්ධ වෙයි. ඉගැනුමට අවස්ථා සොයයි.

වරක් හම්බන්තොට ප්‍රදේශයේ සාර්ථක ව්‍යාපාරික හමුවක් අමතන්නට මා ගිය අවස්ථාවක, එම ව්‍යාපාරිකයින්ගෙන් මා විමසා සිටියේ ඔබ මෙතරම් සාර්ථක ව්‍යාපාරිකයන් වන්නට රහසක් තිබේද යන්නයි. එවිට ඔවුන්ගේ පිළිතුර වුයේ " අපි ව්‍යාපාරිකයින් නිසා යන හැම තැනම බලන්නේ මොනවද අළුත් ව්‍යාපාරික අවස්ථා තියෙන්නේ, මොනවද අපේ ව්‍යාපාරයේ වෙනස් කරගත යුත්තේ, එතකොට අපට ඒවා පෙනෙනවා. අපි ඇවිත් ඒවා ක්‍රියාත්මක කරනවා. එවිට අපේ ව්‍යාපාර නිතරම දියුණුවට ලක්වෙනවා යනුවෙනි. එහි ඔබට ද වටිනා අදහසක් ඇත යන්න අපේ විශ්වාසයයි.

**මොහාන් පල්ලියගුරු**

ප්‍රවීන දේශක, මනෝ විද්‍යා උපදේශක හා මානව සංවර්ධන පුහුණු උපදේශක

BA Econ.sp (SL), Dip in Mkt (USA), Dip in Psy (SL), Certified Trainer – IAF (Germany), Psychological Counselor Motivational Speaker,



සම්පත් බැංකුව

හෙට දින එළිය කරයි

# ඔබ මේ කවරෙකු වූවද? ඔබට අපත් සමග ලෝකය දිනිය හැක




ජීවිතය ඕනෑම මොහොතක, අලුතෙන් පටන් ගන්න පුළුවන්.
ඔබගේ, දැනුම, කුසලතා, ආකල්ප ඉහළටම ගෙනවිත්,
අනාගතයේ ඔබව සාර්ථක ව්‍යවසායකයකු ලෙස
රටට දායක කිරීම, සම්පත් බැංකුවේ අරමුණයි.
අමතන්න - 076 588 66 50

සම්පත් බැංකුවේ තවත් එක් සමාජ සත්කාරයක්

> දේශීය හා විදේශීය වෙළෙඳපොල ජයගනිමින් මහජනතාවට කොටස් නිකුත් කර ලැයිස්තුගත PLC සමාගමක් බවට පත්කිරීමට මා බලාපොරොත්තු වෙනවා.
> ඒ වගේම වාර්ෂිකව ඇඟළුම් 600,000 ක් නිෂ්පාදනය කිරීමටත් ඉදිරි වසර 5ක් ඇතුළත ඇඟළුම් මිලියනයක් දක්වා පුළුල් කිරීමටත් සැළසුම්කර තිබෙනවා.

# මගේ සාර්ථකත්වයේ අත්වැල




**රොෂාන් රාජේෂ් මුණවීර**

සභාපති/කළමණාකාර අධ්‍යක්ෂක

**මන්රෝ හෝල්ඩිංග්ස් (පුද් සමාගම)**


ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ පවත්නා ව්‍යාපාරය වැඩිදියුණු කරගැනීම සඳහා ව්‍යවසායක ඔබට අතහිත දෙන රාජ්‍ය ආයතනයක් වශයෙන් බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය හැඳින්විය හැකියි. පළාතේ කර්මාන්තකරුවන් උදෙසා ජාතික මෙහෙවරක් ඉටුකරන බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ උපදෙස් ඇතිව තම ජීවිතය හැරවුම් ලක්ෂයක් බවට පත් කර ගත් තවත් එක ව්‍යවසායකයෙකු අපට මුණගැසිණි. ඒ "මන්රෝ හෝල්ඩින්ග්ස්" පුද්ගලික සමාගමේ සභාපති/අධ්‍යක්ෂ රොෂාන් රාජේෂ් මුණවීර මහතායි.

**ඔබ සහ ඔබේ පවුල පිළිබඳව හැඳින්වීමක් කළොත්?**

මා ඉපදුනේ කොළඹ කොල්ලුපිටියේ සෙන් මයිකල් පෞද්ගලික සාත්තු නිවාසයේ. මගේ පියා පී.මුණවීර. ඔහු වෘත්තියෙන් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයෙක්. මව ප්‍රසිද්ධ ව්‍යාපාරික පවුලක දියණියක්. පවුලේ එකම දරුවා මම. කොළඹ 10 ශාන්ත ජෝෂප් විදුහලේ තමයි මා අධ්‍යාපනය හැදෑරුවේ. කුඩා කාලයේ මා ඉගෙනීමටත්, ක්‍රීඩාවටත් හරිම දක්ෂයි. විශේෂයෙන් මා ගණිතයට ඉතාම දක්ෂයි. මට මතකයි වරක් මගේ පන්තිභාර ගුරුතුමිය මට ගණිතයට ලකුණු 100 න් 135 ක් දී තිබුණා. ඇයට එතරම්ම මම ගැන විශ්වාසයක් තිබුණා.




ඒ වගේම 4 ශ්‍රේණියේ පටන් මා ක්‍රීඩාවක් වශයෙන් ජපන් සටන් කලාව හැදෑරුවා. එහි සභාපති දක්වා ඉහළට පැමිණියා.

මම විවාහකයි. බිරිඳගේ නම ප්‍රභා. ලොකු පුතා රක්වින්. ඔහුගේ අරමුණ අනාගත Sport Science PHD (ක්‍රීඩා විද්‍යාවේ පශ්චාත් උපාධියක්) කිරීමයි. දෙවැනි පුතා ඩියෝන්. ඔහු අනාගත ඉංජිනේරුවෙකු වීමේ බලාපොරොත්තුවෙන් රොබෝ තාක්ෂණය හදාරනවා. දුව තෙවුමි. ඇය වෛද්‍යවරියක් වීමට බලාපොරොත්තුවෙන් සිටිනවා. මේ වන විට 45 වන වියේ පසුවන මා තෘප්තිමත් පවුල් ජීවිතයක් ගත කරනවා.

**පාසල් අධ්‍යාපනයෙන් පසුව ඔබේ අරමුණ මොකක්ද?**

ඉලක්ක ගත ලොකු අරමුණක් මගේ ජීවිතයේ තිබුණේ නැහැ. නමුත් නීතිඥවරයෙකු වීමේ අදහසක් මගේ හිතේ තිබුණා. ඒ නිසා විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ උසස් අධ්‍යාපනය සිදුකළ ද ඒ කිසිවත් මට ආසාවක් තිබුණේ නෑ. පසුව මා පරිගණක විශ්ලේෂකයෙකු වශයෙන් රැකියාවක් කළා. කුමන රැකියාව කළත් මා ඉන් තෘප්තිමත් වුණේ නැහැ. මට අවශ්‍ය වුණේ මා තුළින් යමක් සෙවීමට. ඇත්තටම එය මගේ ජීවිතයේ හැරවුම් ලක්ෂයක් බවට පත්වුණා.

**ඔබගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය පටන් ගත්තේ කොතනින්ද?**

1994 එක්තරා දිනයක පුවත්පතක පළ වූ දැන්වීමක් මගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය බවට පත්වුණා. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මඟින් පළ කරන ලද එම දැන්වීමේ සඳහන්ව තිබුණේ "නේවාසික ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහනක්" පිළිබඳවයි. ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ආසාවක් තිබුණද ව්‍යවසායකත්වය කියන්නේ මොකක්ද කියලා මට හරිහැටි දැනීමක් අවබෝධයක් තිබුණේ නැහැ.

**පුහුණුවෙන් පසුව ව්‍යාපාරය පටන් ගත්තේ කොහොමද?**

මුල් කාලයේ මා ළඟ එතරම් මුදලක් තිබුණේ නෑ. පොඩි ණයක් අරගෙන සුළුවෙන් විවිධ ව්‍යාපාර කළා. පසුව මා ඇඟළුම් ක්ෂේත්‍රයට යොමු වීමට අදහස් කළා. මුලින් ම කොන්ත්‍රාත් කරුවෙකු ලෙස කටයුතු කරමින් පසුව අපගේම

ඇඟළුම් නිෂ්පාදනය කිරීමට සහ බෙදා හැරීමට පෙළඹුනා.

**මේ වනවිට ඔබේ ව්‍යාපාරයේ තත්වය කොහොමද?**

මගේ ව්‍යාපාරය දැන් පෞද්ගලික සමාගමක් ලෙස ක්‍රියාත්මක වෙනවා. එය මන්රෝ හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම ලෙස නම් කරලා තියනවා. විශාල සේවක පිරිසකට සෘජු හා වක්‍ර රැකියා සපයමින් රජයට ආදායම් බදු ගෙවමින් දේශය ගොඩනැඟීමට මගේ ආයතනය හරහා මා සහයෝගය ලබාදෙනවා.

**ඔබ ආයතනයේ නිපදවන ඇඟළුම් මොනවාද?**

අපගේ දේශගුණික තත්ත්වයට සරිලන ඉතා සරල ඇඳුම් තමයි අප නිෂ්පාදනය කරන්නේ. ඒ අතර අප ළමා, කාන්තා, පිරිමි යන අංශ තුනෙන්ම ඇඟළුම් නිෂ්පාදනය සිදුකරනවා. ඉතාම උසස් තත්ත්වයේ ගුණාත්මක නිෂ්පාදනය තමයි අපි පාරිභෝගිකයන්ට ලබාදීමට කටයුතු කරන්නේ. ඒවා සරල මිළ ගණන් යටතේ පවතින නිසාම වැඩි වැඩියෙන් පාරිභෝගික ආකර්ෂණය අපගේ නිෂ්පාදන සඳහා ලැබෙනවා.

ඔබගේ ආයතනයේ සේවක පිරිස පිළිබඳව සඳහන් කළොත්?

අප ආයතනයේ සෘජු හා වක්‍ර රැකියා සහිත සේවකයන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඔවුන් ඔවුන්ගේ සේවය ඉතා විශිෂ්ට ලෙස සිදුකරනවා. ආයතනයේ දියුණුව වෙනුවෙන් ඔවුන්ගේ කැපවීම අති විශාලයි.

**ඔබගේ බෙදා හැරීමේ ජාලය පිළිබඳ මතක් කළොත්?**

> ඔබගේ අරමුණ ඔබම සොයාගන්න.
> එය හරියට වැලි ගොඩක වැටුණු ඉඳිකටුවක් සොයා ගැනීම වගේ අති දුෂ්කරය. නමුත් උත්සාහ කර මෙය සොයාගන්න. එවිට 90%ක් වැඩ අවසන්.
> ඔබ දුවන්න. නැතිනම් ඇවිදින්න. බැරිනම් බඩගාන්න.
> මේ කුමකට වුවද අරමුණක් තිබිය යුතුය. වැදගත් වන්නේ ක්‍රියාත්මකවීම පමණයි.
> ඒ වගේම තමයි හැකි සෑම අවස්ථාවකම ජීවිතයේ සතුට විඳින්න.

ශ්‍රී ලංකාව පුරා අපගේ බෙදා හැරීමේ ජාලය ක්‍රියාත්මක වෙනවා. ඒ අතර ලංකාවේ අංක එක විලාසිතාගාර වන Kandy, Lady J, ASB, Thilakawardena, CIB, New Sriyani, Richlook, Spring & Summer අපගේ ප්‍රධාන ගැණුම්කරුවන් ලෙස කටයුතු කරනවා. ඇත්තටම මේ බෙදාහැරීමේ ජාලය අපගේ සාර්ථකත්වයට ප්‍රධාන හේතුවක්.

**ඔබ සේවය ලබා ගන්නා ආයතන පිළිබඳ සඳහන් කළොත්?**

කර්මාන්ත සංවර්ධන අධිකාරිය කර්මාන්ත කරුවන් සඳහා විශාල සේවාවක් ඉටු කරනවා. මා ඔවුන් සමග සම්බන්ධ වී කටයුතු කරනවා. ඒ වගේම ඉදිරියේදී ජාතික වාණිජ මණ්ඩලය සමග ද සම්බන්ධ වීමට බලාපොරොත්තු වෙනවා.

**ඔබ මහා පරිමාණ ව්‍යවසායකයෙක්. "ව්‍යවසායකත්වය" ඔබ අර්ථ දක්වන්නේ කොහොමද?**

ව්‍යවසායකයා කියන්නේ ව්‍යාපාරිකයාට වඩා වෙනස් කෙනෙක්. ඔහු හැමවිටම අවධානමක් සමගයි වැඩකරන්නේ. ඒ වගේම ගිනිගෙන දැවෙන ආශාවකින් පසුවිය යුතුයි. විශේෂඥයන්ගේ දැනුම ලබාගන්නා නමුත් සැම විටම විශ්වාස නොකිරීම ද ව්‍යවසායකයාගේ ලක්ෂණයක්. ඇත්තටම හැමෝටම ව්‍යාපාරිකයෙකු වීමට හැකියාවක් තිබුණට ව්‍යවසායකයෙකු වීමේ හැකියාවක් නැහැ.

**කර්මාන්තකරුවන්ගේ දියුණුව උදෙසා ඔබ ගෙනෙන යෝජනා මොනවාද?**

චීනයේ Canton සහ සහ ඊවු වැනි ජාත්‍යන්තර පොළක් වර්ෂ යකට දෙවතාවක් ලංකාවේ සංවිධානය කිරීමට හැකිනම් එය කර්මාන්තකරුවන්ට බෙහෙවින් වටිනවා. මේ තුළින් කුඩා, මධ්‍යම හා මහා පරිමාණ ව්‍යාපාරිකයින්ගේ නිෂ්පාදන සහ සේවා ජාත්‍යන්තරයට අළෙවි කළ හැකියි. එසේම ඒ හරහා සංචාරක ආකර්ශනය වැඩිවීමත් මෙරට රැකියා බිහිවීමත් සිදුවෙනවා. මැලේසියාවේ මෙන් නිවාස යෝජනා ක්‍රම සිරස් අතට ඉදි කරමින් ඒ අවට නිෂ්පාදන ගම්මාන ඇති කිරීමද සිදුකළ හැකිය. එසේම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සුළු, මධ්‍යම හා මහා පරිමාණ ව්‍යාපාර ලෙස ආරම්භ කළහොත් රටේ කුණු ප්‍රශ්නයට වුවද ස්ථිර විසඳුමක් ලබාගත හැකිවෙනවා.

දුෂ්කර පළාත්වල Total Tax Free (free trade zones) ඇතිකර වාර්ෂිකව ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුවක් ලබාගැනීම ද සිදුකළ හැකියි. මෙම ක්‍රමවේදය දැනට ඩුබායි හි ක්‍රියාත්මක වෙනවා.

එසේම පවුල් මට්ටමින් දේශීය නිෂ්පාදන දියුණු කිරීමට ද කළ හැකි අතර මහා පරිමාණ ව්‍යවසායකයින් ගම් මට්ටමින් උප කොන්ත්‍රාත් ලබාදෙමින් රැකියා උත්පාදනය ද ඇතිකළ හැකියි. මේ සඳහා රජය කර්මාන්තකරුවන් විෂයෙහි අත්වැළක් විය යුතුයි.

එසේම ව්‍යවසායකත්වය පිළිබඳව ගම් මට්ටමින් පුහුණුව ලබාදීමත්, ව්‍යවසායකයින් දිරිමත් කිරීමත් ඔවුන්ට නිසි පහසුකම් ලබාදීමත් මගින් කර්මාන්ත ක්ෂේත්‍රය දියුණු කිරීමේ හැකියාව තිබෙනවා. එසේම ඔවුන් ජාත්‍යන්තරය සමඟ සම්බන්ධ කිරීමත්, ඔවුන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ණය පොළී අනුපාත ලිහිල් කිරීමත්, බදු සහන ලබාදීමත් ජාත්‍යන්තර වශයෙන් ලාංකිය ව්‍යවසායකයා පිළිගන්නා තත්ත්වයට පත්කිරීමට කටයුතු කිරීමත් රජයට සිදුකළ හැකියි.

එසේම ව්‍යවසායකයා වෙනුවෙන් අළෙවිකරණ ක්‍රමවේදයක් සලසා දියයුතුයි. විවිධ සංකල්ප නිර්මාණය

කරමින් අලෙවිකරණ ව්‍යාපෘති දේශීය, විදේශීය වශයෙන් ස්ථාපිත කළ යුතුයි. මීට අමතරව අප රට දියුණු කිරීමට අවශ්‍ය ආකල්ප වර්ධනයත්, සංකල්ප වර්ධනයත් ඇති කිරීමට වගකිවයුතු බලධාරීන් උනන්දු විය යුතුයි.

**ඔබගේ අනාගත සැළසුම් පිළිබඳව කථා කලොත්?**

දේශීය හා විදේශීය වෙළෙඳපොල ජය ගනිමින් මහජනතාවට කොටස් නිකුත් කර ලැයිස්තුගත PLC සමාගමක් බවට පත්කිරීමට මා බලාපොරොත්තු වෙනවා. ඒ වගේම වාර්ෂිකව ඇඟළුම් 600,000 ක් නිෂ්පාදනය කිරීමටත් ඉදිරි වසර 5ක් ඇතුළත ඇඟළුම් මිලියනයක් දක්වා පුළුල් කිරීමටත් සැළසුම්කර තිබෙනවා.

විශේෂයෙන්ම සුළු පරිමාණයේ සිට මධ්‍ය පරිමාණය දක්වා ගම් මට්ටමින් විහිදුණු විශාල පිරිසකට උප කොන්ත්‍රාත් ලබාදීම දැනට සිදුකරන අතර ඉදිරියේදී සියලුම දිස්ත්‍රික්ක සඳහා මෙය විහිදුවමින් වක්‍ර රැකියා ලබාදීමට මා කටයුතු කරනවා.

“ජාතියේ ඇඟළුම් සහකරු” (Nation Apprael Partner) ලෙස විරුදාවලිය ලබමින් සෑම මිනිත්තුවකටම ලෝකය පුරා අපගේ ඇඟළුම් නිෂ්පාදන අලෙවි කිරීමේ සංකල්පය මා තුළ තිබෙනවා. ඉදිරියේදී එය සාර්ථක කරගනිමින් නව සංකල්ප ඔස්සේ කටයුතු කරමින් ව්‍යාපාර මෙන්ම ජීවිතය ද දිනන්නට මා සූදානම්.

**කරමාන්තකරුවන් විෂයෙහි ලබාදිය හැකි උපදෙස් මොනවාද?**

‘ඔබගේ අරමුණ ඔබම සොයාගන්න’ එය හරියට වැලි ගොඩක වැටුණු ඉඳිකටුවක් සොයා ගැනීම වගේ අති දුෂ්කරය. නමුත් උත්සාහ කර මෙය සොයාගන්න. එවිට 90%ක් වැඩ අවසන්. ඔබ දුවන්න. නැතිනම් ඇවිදින්න. බැරිනම් බඩගාන්න. මේ කුමකට වුවද අරමුණක් තිබිය යුතුය. වැදගත් වන්නේ ක්‍රියාත්මකවීම පමණයි. ඒ වගේම තමයි හැකි සෑම අවස්ථාවකම ජීවිතයේ සතුට විඳින්න.

ඉදිරියේදී තම සභාපතිත්වයෙන් යුත් ජාත්‍යන්තර සමාගමක් ඇරඹීමට බලාපොරොත්තු වන රෝෂ න් මහතා ඉන් බලාපොරොත්තු වන්නේ කර්මාන්තකරුවන් වන ඔබට විදේශ රටක තම ව්‍යාපාර ස්ථාපිත කරගැනීමට අවශ්‍ය උපදෙස් හා පහසුකම් සැලසීමයි. ඒ සඳහා කර්මාන්තකරුවෙකු වශයෙන් ඔබටත් තොරතුරු අවශ්‍ය නම් පහත විමසීම් මඟින් සම්බන්ධ වියහැකියි.

(0715 642270 මුණවීර)

**සාගරිකා සඳමාලි**
MA,BA (Econ) University of Kelaniya)
කර්මාන්ත සංවර්ධන නිලධාරී







# කර්මාන්තකරුවන්ගේ මහගෙදරින් කාන්තා ව්‍යවසායිකා ඔබට සවියක්

අතීතයේ සිට සමාජයේ පවුල් නඩත්තුව වෙනුවෙන් තම දෑත මෙහෙයවා දහඩිය වගුරවන්නේ පුරුෂ පාර්ශවය යැයි කීම අසාධාරණ නොවේ. එහෙත් පුරුෂයා වටා යෝධ බැම්මක් මෙන් නොසෙල්වී සවි ශක්තිය සපයන්නේ ගැහැනිය යැයි කීමද අයුක්ති සහගත නොවේ. ඒ තරමට ම කාන්තාව, පුරුෂයා හා කරට කර තමාගේ හෝ පවුලේ ජීවිතය වෙනුවෙන් බැරෑරුම් සටනක යෙදෙන්නීය.

කාන්තාව ආත්ම පරිපූර්ණත්වයට පත්වීම යනු සමස්ත සමාජයේම අභිවෘද්ධියේ පදනම සවිමත් වීමයි. වර්තමාන සමාජයේ කාන්තාව සියල්ල අභිබවා ඉදිරියට ගොස් හමාරය. එදා සමාජයේ පැවැති සාම්ප්‍රදායික ආකල්ප අනුව ගැහැනියකට පැවරී ඇති කාර්යය කොටස් ද නොපිරිහෙළා ඉටුකරමින්, සමාජ සම්මත රැකියාවන්හි ද නිරත වෙමින් ජවනිකා කිහිපයක් සාර්ථකව රඟදක්වන්නී ඇයයි. මේ නිසා කාන්තාව හඳුනාගත යුත්තේ ආර්ථික වශයෙන් පෙරටුගාමී චරිතයක් රඟ දැක්විය හැකි අයෙකු විලසිනි. වර්තමාන සමාජයේ කතුන්, පිරිමින් හා උරෙනුර ගැටෙමින් පවුලේ හා රටේ සංවර්ධනය වෙනුවෙන් ඔවුන් අතින් ඉටුවන මෙහෙවර අනභිබවනීය වේ. එබැවින් රජය විසින් කාන්තාවට සුවිශේෂී වූ කාර්යයන් සඳහා පහසුකම් සැලසිය යුතු අතර කාන්තාව දිරි ගන්වමින් ඇයගේ අභිවෘද්ධිය උදෙසා ද කටයුතු කළ යුතුය.

ව්‍යාපාර ක්ෂේත්‍රයේ කාන්තාවට හිමිවිය යුතු පැවැත්ම තීරණ කිරීම සමාජීය කාර්යයකි. එහිදී ව්‍යවසායක කාන්තාව වෙනුවෙන් ඔවුන්ගේ ව්‍යාපාර වැඩිදියුණු කිරීම විෂයෙහි අත්වැලක් සැපයීමට නම් ඔවුන් මුහුණු දී ඇති දුෂ්කරතා පිළිබඳව සොයා බැලිය යුතුය. එහිදී හඳුනාගෙන ඇති කාරණා අතර ව්‍යවසායකත්ව, තාක්ෂණික හා මූල්‍ය කළමනාකරණ දැනුම විෂයෙහි හිඟතාවක් පැවතීම, ව්‍යාපාර ආරම්භ කිරීම - ව්‍යාප්ත කිරීම විෂයෙහි මූල්‍ය අවහිරතාවන්ට මුහුණදීම යනාදිය සඳහන් කළ හැකිය.

***නව කර්මාන්තයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන කාන්තාවන් සඳහා අවශ්‍ය තාක්ෂණය ලබාදීම සිදුකරන අතර මේ වන විට ඇඟළුම් ක්ෂේත්‍රය, පාවහන් නිෂ්පාදනය, ගමන් මළු නිෂ්පාදනය, බිම්මල් වගා කිරීම ආදී ක්ෂේත්‍ර සඳහා පුහුණු වැඩසටහන් පවත්වා ඊට අවශ්‍ය දැනුම ලබාදී තිබේ.***

මෙකී දුෂ්කරතා හමුවේ කාන්තා ව්‍යවසායකයන් වෙනුවෙන් අත්වැලක් සැපයීමට බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මූලිකත්වය ගෙන සිටීම ඉතා වැදගත් කොට සැලකිය හැකිය. කර්මාන්ත කරුවන්ගේ මහගෙදර වශයෙන් හඳුන්වන බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් පළාතේ කර්මාන්තකරුවන් හා ඔවුන්ගේ විෂයෙහි මූල්‍ය අතහිත දීම් මෙන්ම ඔවුන්ගේ සේවා අවශ්‍යතා සැපයීමට කටයුතු කරනු ලැබේ. එහිදී කාන්තා ව්‍යවසායකයින් සවිබල ගැන්වීම් මේ වන විට සිදුකරගෙන යන සුවිශේෂී ව්‍යාපෘතියක් වශයෙන් හඳුනා ගත හැකිය. මෙම ව්‍යාපෘතිය යටතේ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර එහිදී ව්‍යවසායකයන්ගේ දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීම අලෙවිකරණ හා තාක්ෂණ සහාය සහ මූල්‍ය සහයෝගය ලබාදීම ආදිය පිළිබඳව දැනුවත් කෙරේ.



**කාන්තාව ආත්ම පරිපූර්ණත්වයට පත්වීම යනු සමස්ථ සමාජයේම අභිවෘද්ධියේ පදනම සවිමත් වීමයි. වර්තමාන සමාජයේ කාන්තාව සියල්ල අභිබවා ඉදිරියට ගොස් හමාරය.**

මෙම කාන්තා ව්‍යවසායකයින් බිහිකිරීමේ සාමාජීය වගකීම ඉටුකිරීමෙහි ලා කටයුතු කරන බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් පසුගිය වසර කිහිපය තුළ විවිධ වැඩසටහන් පවත්වන ලදි. ඒ අතර ආහාර නිෂ්පාදනයෙහි යෙදෙන කාන්තාවන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘති, දිරිය වනිතා (රොටරි සමාජය හා ඒකාබද්ධව සිදුකරන ව්‍යාපෘති) තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම, මූල්‍ය පහසුකම් ලබාදීම ආදිය සඳහන් කළ හැකිය.

මෙහිදී ආහාර නිෂ්පාදයෙහි යෙදෙන කාන්තාවන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘති තුළදී විවිධ ආහාර නිෂ්පාදනය කරන ආකාරය, ඒවා කල් තබා ගන්නා ආකාරය සහ අලෙවිය පිළිබඳව දැනුවත් කිරීම සිදුකරනු ලබයි. එසේම කාන්තා ව්‍යවසායකයන් සවිබල ගැන්වීම සඳහා රොටරි සමාජය හා ඒකාබද්ධව පළාතේ දිරිය කාන්තාවන් තව දුරටත් දිරිගැන්වීමේ අරමුණින් "දිරිය වනිතා ව්‍යාපෘතිය" දියත් කර තිබේ. එමගින් දැනටමත් කර්මාන්තයක නියැලී සිටින කාන්තාවන්ට එම කර්මාන්ත දියුණු කර ගැනීමට හා වඩාත් කාර්යක්ෂම කර ගැනීම සඳහා නොමිලේ උපකරණ ලබා දීම සිදුකරයි. එසේම තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීමේ ව්‍යාපෘතිය මගින් නව කර්මාන්තයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන කාන්තාවන් සඳහා අවශ්‍ය තාක්ෂණය ලබාදීම සිදුකරන අතර මේ වන විට ඇඟළුම් ක්ෂේත්‍රය, පාවහන් නිෂ්පාදනය, ගමන් මළු නිෂ්පාදනය, බිම්මල් වගා කිරීම ආදී ක්ෂේත්‍ර සඳහා පුහුණු වැඩසටහන් පවත්වා ඊට අවශ්‍ය දැනුම ලබාදී තිබේ. එසේම කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් කාන්තා ව්‍යවසායකයන් සඳහා මූල්‍ය පහසුකම් සලසමින් ඔවුන් පවත්වාගෙන යන කර්මාන්තය දියුණු කර ගැනීම සඳහා අත හිත දෙනු ලැබේ.

බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය කාන්තා ව්‍යවසායකයන් සවිබල ගැන්වීමේ විෂයෙහි ලබාදෙන දායකත්වය අති විශාල බැවින් කාන්තා ඔබට ද නිෂ්පාදන ක්ෂේත්‍රයට දායක වී තමන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමට හැකියාව පවතී. ඒ සඳහා ඔබට බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය හා සම්බන්ධ වී අදාළ තොරතුරු දැනගත හැකිය.

විමසීම
**සාගරිකා සඳමාලි**
MA,BA (Econ) University of kelaniya
කර්මාන්ත සංවර්ධන නිලධාරී

අංක 4 -ඒ 1/1
සෝරත මාවත ගංගොඩවිල
නුගේගොඩ



1986 වර්ෂයේ පටන් මේ දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක වන දේශීය ව්‍යවසායකයන්ට හා විදේශීය වෙළඳපලට අවශ්‍ය ඕනෑම ආකාරයක යන්ත්‍ර සූත්‍ර නිපදවන ප්‍රධාන ආයතනය සී/ස ටොරෙන්ටෝ ඉංජිනියරින් (පුද්) සමාගමයි. මෙම ආයතයෙන් ව්‍යවසායකයන්ට ලැබෙන අත්වැල අති විශාලයි.

වර්ෂ 1986 දී වත්මන් කළමනාකාර අධ්‍යක්ෂ ජීවනශ්‍රී දයන්ත ද සොයිසා සිය වෘත්තීය අත්දැකීම් මුල්කර ගනිමින් ස්වයං රැකියාවක් වශයෙක් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් විෂයෙහි අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර නිපදවීම ආරම්භ කළේය. මෙමගින් වෙළඳපල තුළ දේශීය යන්ත්‍ර සූත්‍ර සඳහා වූ හිඩැස සම්පූර්ණ කිරීමට හැකියාවක් ලැබිණි.

මෙම යන්ත්‍ර සූත්‍ර නිර්මාණය සුළු මහා පරිමාණ වශයෙන් ව්‍යාප්තවන්ට වූ අතර **පාවහන් නිෂ්පාදනයට අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා කැපුම් අච්චුවලට අමතරව, මුද්‍රණ කර්මාන්තය, සම් භාණ්ඩ කර්මාන්තය, රෙදිපිළි කර්මාන්තය, පොලිතින් කර්මාන්තය යනාදී සියලු කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අදාළ යන්ත්‍ර සූත්‍ර** මෙම ආයතනය මගින් නිපදවන ලදි. එපමණකින් නොනැවතුණු සී/ස ටොරෙන්ටෝ ඉංජිනියරින් (පුද්) සමාගම විදේශීයව ද තම ලාංකික නාමය තහවුරු කර ගනිමින් අපනයනය කෙරෙහි ද යොමු විය. මේ අවධිය විදේශයෙන් යන්ත්‍ර සූත්‍ර ආනයනය වූ යුගයක් වූ බැවින් එදා 2005 වර්ෂයේ මෙම ආයතනය තැබූ පියවර මෙරටට විදේශ විනිමය උපයා දීමට තැනූ යෝධ පිම්මක් බවට පරිවර්තනය විය. **ඒ අනුව දකුණු අප්‍රිකාව, පැපුවා නිව්ගිනියාව, ඉන්දියාව වැනි රටවලට යන්ත්‍ර සූත්‍ර අපනයනය සිදුවිය.**

2010 වර්ෂයේ ආරම්භයේදී පාවහන් ක්ෂේත්‍රයේ කර්මාන්තකරුවන් විෂයෙහි අවශ්‍ය සියලුම යන්ත්‍ර සූත්‍ර සපුරාලීමට සමත් වූ මෙම ආයතනය නව වෙළඳපල මානයන් කරා යමින් ඇඟළුම් හා නිදහස් වෙළඳ කලාපීය කර්මාන්ත කරුවන් සඳහා අවශ්‍ය වන්නා වූ නවීන තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුව ක්‍රියාත්මක වන පාරිභෝගික අවශ්‍යතාවයන්ට අනුව සැලසුම් කර නිර්මාණය කරන ලද යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය හා අළෙවියට අත්පොත් තැබීය. **වර්තමානය වන විට බියගම, කටුනායක, වතුපිටිවල යනාදී සියලුම නිදහස් වෙළඳ කලාප විසින් විදේශීය රටවලින් ගෙන්වන යන්ත්‍ර සූත්‍ර වෙනුවට සී/ස ටොරෙන්ටෝ ඉංජිනියරින් (පුද්) සමාගම විසින් නිපදවන ලද යන්ත්‍ර සූත්‍ර කෙරෙහි විශ්වාසය තබා අවසන්ය.** මෙම ජයග්‍රහණය දේශීය කර්මාන්තයක් ඉතා කෙටිකලක් තුළ සපුරා ගත් සුවිශේෂී කඩඉමක් වශයෙන් ද සැලකිය හැකියි.



තවද ඉන්ධන දහනයට හා පරිසර හිතකාමී බවට පිළියමක් වශයන් 2020 දශකයේදී රජය විසින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ "විදුලි වාහන භාවිතය" ව්‍යාප්ත කිරීමේ සංකල්පය මෙම ආයතනය විසින් දැනටමත් සපුරාගෙන අවසන්ය. එහි දී වර්තමානයේ මෙම ආයතනයේ නවතම නිෂ්පාදනය වනුයේ ඉන්ධන භාවිතයෙන් තොරව බැටරි භාවිතයෙන් ක්‍රියාත්මක වන පරිසර හිතකාමී විදුලි වාහන (R-vehaicle) නිෂ්පාදනයයි. බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය හා එක්ව නියමු ව්‍යාපෘතියක් වශයෙන් ආරම්භ කර ඇති මෙම පරිසර හිතකාමී විදුලි වාහනය කෘෂිකාර්මික, කාර්මික සේවා, සංචාරක හෝටල්. උද්‍යාන වාහන යනාදී ඕනෑම ක්ෂේත්‍රයකට භාවිත කළ හැකි නවීන නිර්මාණයන් වීම සුවිශේෂී වේ.



# ඔබේ අවශ්‍යතාවය යන්ත්‍රෝපකරණ නම් TORENTO Engineering Pvt Ltd ඒ වෙනුවෙන්මයි



පරිසර හිතකාමීවීම, පහසුවෙන් භාවිත කළ හැකි වීම හා නඩත්තු කළ හැකි වීම, පිරිමැසුම්දායී බව යනාදී වාසි මත දේශීය වෙළඳපල තුළ මෙය ඉතා සීඝ්‍රයෙන් ප්‍රචලිත වනු ඇතැයි අපේක්ෂා කරන අතර අනාගත වෙළඳපල ජයගැනීම සඳහා මෙම ආයතනය විසින් මේ අවධියේ නිපදවන ලද හොඳම නවෝත්පාදනය මෙය වීම ඔවුන් තැබූ තවත් එක් සාර්ථක පියවරක් වශයෙන් හඳුනාගත හැකිය.

මෙම ආයතනය තුළ නිපදවන යන්ත්‍ර භාවිතය මඟින් විශාල වාසි රැසක් අත්කරගත හැකිය. එම වාසි අතර..

වඩාත් ලාභදායී මිළ ගණන් පැවතීම
පරිසර හිතකාමී භාවිතය
කාර්යක්ෂමතාවය රඳවාගත හැකිවීම
වඩාත් ප්‍රයෝජනවත් හා පහසුවෙන් භාවිත කළ හැකිවීම.
අලෙවියෙන් පසු සේවා හා උපදේශන සේවා
විශ්වාසයෙන් යුතුව භාවිත කළ හැකි වීම
නඩත්තුව හා අළුත්වැඩියාව පහසුවීම
කාර්මික හා තාක්ෂණික උපදෙස් ලබාගත හැකිවීම.
පැය 24 පුරා වූ සේවය යනාදිය සඳහන් කළ හැකිය. මෙම වාසි හේතුවෙන් පාරිභෝගිකයා නිරන්තරයෙන් සී/ස ටොරෙන්ටෝ ඉංජිනියරින් (පුද්) සමාගම හා එක්ව බැඳීසිටී.

දිවයිනේ හොඳම ව්‍යවසායක ස්වර්ණ සම්මානය, ජනාධිපති සම්මානය, අගමැති සම්මානය, ගෞරව සම්මාන යනාදී ජාතික තලයේ නොයෙකුත් සම්මානත්, ජාතික ශිල්ප සභාව, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය කර්මාන්ත අමාත්‍යාංශය යනාදී ආයතන මඟින් පිරිනමන ව්‍යවසායකත්ව සම්මාන 50 කට අධික ප්‍රමාණයක් ද ශ්‍රී ලංකාවේ කාර්මික ක්ෂේත්‍රයේ දියුණුවට දායකවීම මත එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් පිරිනමන ගෞරව නාමයකින් පිදුම් ලද සී/ස ටොරෙන්ටෝ ඉංජිනියරින් (පුද්) සමාගම වර්ෂ 1986 සිට මේ දක්වා පැමිණි ගමන් මඟ තුළ හිමිකරගත් වටිනාකම් අපමණය.

මෙම ආයතනයෙන් ඔබට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමට අපේක්ෂා කරන්නේ නම් පහත අංක වලින් ඒ පිළිබඳව විමසිය හැකිය.

විමසීම් - කළමනාකාර අධ්‍යක්ෂ ජීවන ශූරී දයන්ත ද සොයිසා
**සී/ස ටොරෙන්ටෝ ඉංජිනියරින් (පුද්) සමාගම**
නො.2/ඒ වැබඩ නැගෙනහිර, වැබඩ
0112 972433, 0115 670231
Email: info@torento.biz



## ගෝලීය උෂ්ණත්වය පාලනයට

# පරිසර හිතකාමී දැව කර්මාන්තය



කාලයත් සමග බොහෝ දේ වෙනස් වෙමින් ඇත. රෝදයෙන් යාත්‍රාවෙන් ඇරඹුන සංවර්ධන ක්‍රියාවලිය මානව වංශ කතාවේ පුණරුදය යැයි අර්ථ ගැන්වීය. ගල් අඟුරු, ඛණිජ තෙල් වැනි බලශක්ති ප්‍රභවයන් මෙම ක්‍රියාවලියේ ග්‍රාමක බලවේගයන් බවට පත් කරමින් මිහිතලයේ අවුරුදු මිලියන ගණනක් තුළ සිදු වූ ක්‍රමික විකාශනය ක්ෂණික වෙනස් වීමක් දක්වා පරිවර්තනය විය.

නූතන මිනිසාගේ සංවර්ධනය එක් යුගයකදී මනා අනගි නිපයුමක් යැයි විද්‍යාව විසින් හඳුන්වා ලොවට පිළිගන්වන ලද ද එයම මේ වනවිට මහ විපත්තිගාමී බව විද්‍යාව විසින්ම ලොවට හෙළි කර ඇත. දිනෙන් දින ඉහළ යන ගෝලීය උෂණත්වය මිහිමවගේ සියළු බැඳීම් එකින් එක ලිහිල් කර දියකර හරින්නේ නූතන මානව ක්‍රියාවලියේ ප්‍රතිවිපාක හේතුවෙනි.

සංවර්ධන ක්‍රියාවලිය තුළ අතුරු ප්‍රතිඵල ලෙස ලොවට මුදා හරින කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය දිනෙන් දින ඉහළ යාම දේශගුණ විපර්යාසයන් ඇති කිරීම දක්වා පරිසරය අසමතුලිත වී ඇත. එය කොතෙක්ද යත් ස්වභාවික ක්‍රියාවලිය තුළ සාගරයට හා තුරුලතාවන් විසින් සිදු කරන අවශෝෂණ මට්ටමට එහා ගිය කාබන් ප්‍රමාණයක් දිනකට මිහිතලයට මුදාහැරේ. **මේ වනවිට වායුගෝලයට දරාගත හැකි කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයද ඉක්මවා ගොස් ඇත. වායුගෝලයට දරාගත හැකි කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය වන්නේ පාස්පර් මිලියන 350කි. අද වනවිට එය පාස්පර් මිලියන 389 දක්වා ඉහළ ගොස් ඇත.** මෙය මෙතනින් නොනවතින බැවින් ඉදිරියේදී මෙය තවත් වැඩිවනු ඇත.

දිනෙන් දින මානව අවශ්‍යතාවයන් මත තුරුලතාවන්ට සිදුවන හානිය සැලකිය යුතු මට්ටමකින් වැඩි වී ඇත. ගෝලීය සමතුලිතතාවය රැකගැනීමට මහත් වෙහෙසක් දරණ සාගර පද්ධතියේ ජල ප්‍රසාරණය හේතුවෙන් හා ග්ලැසියර් දියවී එකතු වන ජලය හේතුවෙන් මේ මොහොත වනවිට ද පුංචි දූපත් ලෝක සිතියමෙන් මැකීයමින් ඇත. දේශගුණික අසමතුලිතතාවය මත සිදුවන විපර්යාසයන් හේතුවෙන් දැඩි නියං තත්වයන්, ලැව් ගිණි, ගං වතුර, නායයෑම්, රෝග පැතිරයෑම්, සුනාමි වැනි දේශගුණික විපත් ඇතිවෙමින් එකිනෙකට බද්ධ සියළු පරිසර බැමි ලිහෙමින්, අනුමානයක්වත් සිදුකළ නොහැකි ආකාරයේ විපර්යාස සිදුවෙමින් ඇත.

මෙහි ඇති අනුවේදනීය සත්‍ය නම් එදිනෙදා අපගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා සිදුකරන මහා පරිමාණ නිෂ්පාදන ක්‍රියාවලියේදී මිහිතලයට මුදාහරින කාබන් ටොන් මිලියන ගණනින් එකතු වීමේ ප්‍රතිඵලය මත මෙම විනාශයන් සිදුවන බවය. ඒ අනුව මෙම මිහිතලය විනාශයට හේතු සාධක වේගවත් කරනුයේද මිනිසා විසින් ම වීම මෙහි ඇති නපුරුම සත්‍යය වේ. **මෙම තත්වය වටහාගෙන වහාම ක්‍රියාත්මක වී ක්ෂණික පාලනයක් සිදු නොකරන්නේ නම් මානව වංශ කතාවේ අවසාන පරිච්ඡේදය වැඩි ඈතකට නොගොස්ම අවසන් කිරීමට සිදුවන බව නොඅනුමානය.**

මිනිසාගේ වර්තමාන ජීවන රටාව ආකල්පමය වශයෙන් නාස්තිකාර එකක් වී තිබීම මෙම බොහෝ ගැටළු වලට හේතූන්ය. මුළු මහත් සමාජයම අධි පාරිභෝගික වීමට ප්‍රයත්න දැරීම නව ප්‍රවණතාවයක් වී ඇති තත්ත්වයක් තුළ එය ක්ෂණිකව පාලනය කළ නමුත් අප ඇබ්බැහි වී ඇති දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වී ඇති නව නිපැයුම්කරණය ක්ෂණිකව නවත්වාලීමට ඔබත් මාත් ඇතුලු කිසිදු මිනිසෙකු එකඟ කරගැනීමට කිසිදා නොහැකි වනු ඇත. නමුත් යුගයේ කාලීන අවශ්‍යතාවයක් වශයෙන් අප මෙහි පෙන්වා දෙන්නේ මෙම අර්බුදය කළමනාකරණය



කිරීමට හැකි ප්‍රවේශ වෙත අප වහා ළඟාවිය යුතුය යන්නය.

විශේෂයෙන් මෙහි දී පරිසර හිතකාමී නිෂ්පාදන හඳුන්වා දීමේ සිට සම්පත් සකසුරුවම්ව භාවිතයට සත්පුරුෂ ආකල්ප වර්ධනය කිරීම යුගයේ අවශ්‍යතාවයක් වී ඇත. මෙහිදී විශේෂයෙන් ශාක ගහණය මිහිතලයේ වැඩි වශයෙන් ව්‍යාප්ත කිරීමත් හා මානව අවශ්‍යතාවයන් සඳහා සම්පත් භාවිතයේදී සකසුරුවම්ව හා සම්පත් මනා කළමනාකරණයකට යටත්ව භාවිතා කරන්නේ නම් අත ළඟ ඇති අර්බුදය කල් දමා ගැනීමට හැකිවනු ඇත.

පරිසර හිතකාමී කර්මාන්තකරණයේදී අප මෙහි විශේෂිත අවධානය දැව කර්මාන්තය කෙරෙහි යොමු කරන අතර සෑම දැවමය නිෂ්පාදනයක්ම පදම් කළ දැවයෙන් නිර් මාණය කරන්නේ නම් එමඟින් අපගේ අවශ්‍යතාවය සපුරා ගැනීම මෙන්ම අනාගතය වෙනුවෙන් සකසුරුවමක් ද කළහැකි වන්නේය. **වැඩි වශයෙන් වාණිජ දැව වගාව සිදුකිරීම කාබන් බලාගාර තැනීමක් වනවා ඇත.** දැව කෙටි කාලීනව දිරාපත් වීමෙන් සිදුවන්නේ ගබඩා වල ඇති කාබන් වායු ගෝලයට පිට කිරීම වන බැවින් එම ශාක භාවිතා කර ගොඩනැගිලි ඉදිකිරීම් හා ගෘහභාණ්ඩ සැකසීමේදී **දැව පදම් කර භාවිතයට ගැනීමෙන් දීර්ඝ කාලයක් ඒවා දිරාපත් නොවී සුරක්ෂිතව තබාගැනීම මෙන්ම දීර්ඝ කාලයක් කාබන් ගබඩා කර තබා ගත හැකි ද වන්නේය. එමඟින් ඒවා දිරාපත් නොවී නිවාස හා ගොඩනැගිලි තුළ දැවමය උපකරණ ලෙස එම කාබන් සංචිත තවත් දශක කිහිපයක් වායුගෝලයට එක් නොවී සුරක්ෂිතව පවතිනවා ඇත.**

මෙසේ දශක කිහිපයක් දැවමය නිෂ්පාදන සුරක්ෂිතව පැවතීමට නම් දැව කර්මාන්තකරුවා අතින් සුවිශේෂී කාර්යභාරයක් සිදුවිය යුතුය. එනම් එම දැව නිසි ලෙස පදම් කර භාවිතයට වෙළෙඳ පොලට නිකුත් කිරීමයි. වාණිජ රබර් වගාව උදාහරණයට ගන්නේ නම් එම වගාවෙන් බලාපොරොත්තු වන රබර් කිරි ගැනීමෙන් පසු දැව කඳන් ඉරා පදම් කර ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගැනීමෙන් එම දැව වල තැන්පත් කාබන් ටොන් මිලියන ගණනක් දශක කිහිපයකට නැවත වායු ගෝලයට එක්වීම වලකාලයි. එමෙන්ම අඩු වටිනාකමක් ඇති යැයි සම්මත මෙම දැව වර්ග සඳහා වැඩි වටිනාකමක් ලැබීම මඟින් වාණිජමය වාසිය ද අත්පත් වේ. අඹ, ලුණුමිදෙල්ල වැනි ශාක වර්ග මෙන්ම කොස්, නැඳුන්, බුරුත වැනි දැව වර්ග ද පදම් කිරීමෙන් එම දැව වල වාණිජමය වටිනාකම කිහිප ගුණයකින් වැඩිවේ. **මේ අනුව ලෝක පරිසර අර්බුදය හමුවේ දැව කර්මාන්තය සඳහා වාණිජ දැව වගාව මෙන්ම පදම් කළ දැව භාවිතය වඩාත් වාසි දායක ප්‍රවේශයක් වී ඇත.**

ජීවිත කාලයටම තනන එකම නිවහන සඳහා අප හොඳම දේ භාවිතා කිරීමට කැමැත්තෝ මෙන්ම පරම්පරා ගණනකට එහි කල්පැවැත්ම ද දකින්නට කැමැත්තෝ වෙමු. නමුත් අපි භාවිතයට ගනු ලබන දැව වල 50%කට වැඩියෙන් ජලය රැඳී ඇති බැවින් කෙටි කාලීනව එම දැව විවිධ උපද්‍රවයන්ට ලක් වී දිරා පත් වී යන්නේ බලාපොරොත්තුන් ද බිඳ දමමිනි. මෙමඟින් සිදු වන්නේ අපගේ මුදල අපතේ යාමත්, දැව වල ආයු කාලය අඩු වීමත් නිසා නැවත නැවතත් ගස් කැපීමට සිදුවීමෙන් වනාන්තර විනාශය සීඝ්‍රවීමත්ය.

මේ වනවිට ලෝකයේ සුප්‍රකට දැව භාණ්ඩ නිෂ්පාදකයින්ගේ භාණ්ඩවල ප්‍රමිතිය අනෙක් නිෂ්පාදකයන්ගෙන් වෙනස් වීමේ රහස ද මෙම විද්‍යාත්මක දැව පදම් කිරීමේ ක්‍රමවේදයන් භාවිතා කිරීමයි. **වර්තමානයේ ශ්‍රී ලංකාවේද මෙම විද්‍යාත්මක තාක්ෂණික ක්‍රමවේදය අල්ප වශයෙන් භාවිතා වුවද එය ව්‍යාප්ත නොවන්නේ ඇතැම් කර්මාන්ත කරුවන් මෙය තම භාණ්ඩ වල ගුණාත්මකභාවය රහසක් වශයෙන් පවත්වාගෙන යාමේ වුවමනාව නිසාවෙනි.** නමුත් දියුණු රටවල දැව භාණ්ඩ නිෂ්පාදනයේ දී අනිවාර්යයෙන්ම දැව විද්‍යාත්මකව පදම්කළ යුතු වන අතර එමඟින් එම කර්මාන්තයට ද යහපතක් සිදුවේ. මෙය වර්තමානයේ ජාතික අවශ්‍යතාවයක් වශයෙන් සලකා හැකි සෑම අවස්ථාවකම පදම්කළ දැව භාවිතයට යොමු වීම ගෝලීය උෂ්ණත්වය පාලනය කිරීමට යම් මට්ටමකින් ඔබත් දායක වනවා යැයි ආඩම්බර විය හැකි අතර මූල්‍යමය ප්‍රතිලාභයන් ද දිනා ගැනීමේ සතුට අවංකව භුක්ති විඳිය හැකි වනු ඇත.



**ආර්. තරංග බමුණුසිංහ**
BA (Sp.Geo)) University of Peradeniya
කර්මාන්ත සංවර්ධන නිලධාරී
බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

# “බස්නාහිරට පායා ඇති හිරු එළිය ඔබත් දකින්න”



## කර්මාන්ත ව්‍යාපාර ඉහළට ඔසවා තබන බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය

බස්නාහිර පළාතේ කර්මාන්ත හා ව්‍යාපාරවල යෙදෙන කර්මාන්තකරුවන්ගේ ආර්ථික හා සුභ සාධන කටයුතු ඉහළට ඔසවා තබන බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිළිබඳව මීට වසර 10 කට පෙරදී හඳුනාගන්නට ලැබුණා. මා මොරටුවේ වඩු හිමියන්ගේ සංගමයේ සභාපති වශයෙන් රාජ්‍ය ආයතන හා අමාත්‍යාංශ වලට  සම්බන්ධව කටයුතු කරන අවධියේ  බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය හා එක්ව මොරටුවේ වඩු කර්මාන්තයේ යෙදෙන කර්මාන්තකරුවන්ගේ දැවෙන ප්‍රශ්න විසඳීමට පියවර ගත්තා. හුදෙක්ම එය මොරටුවේ දැව කර්මාන්තකරුවන්ගේ ජයග්‍රහණයක් ලෙස මා දකින අතර, බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරියට ඒ පිළිබඳව විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.
බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරියේ නව සභාපති රෙහෙන්සිරි වරාගොඩ මැතිතුමා හා ප්‍රධාන විධායක තැන්පත් ප්‍රසන්න සුජිත් කුමාර මැතිතුමා ඇතුළු සියළුම කාර්යය මණ්ඩලය ඔවුන්ගේ සේවා කාලය පැය අටකට සීමා නොකර පළාතේ කර්මාන්ත හා ව්‍යාපාර ඉහළට ඔසවා තැබීම සඳහා කරන කැපවීම අගය කළ යුතු දෙයක්. එසේම ඔවුන්ගේ අප්‍රමාණ කැපවීමේ ප්‍රතිඵල අද ද අප සතුටින් භුක්තිවිඳින බව සිහිපත් කළ යුතු වෙනවා.



ඔබත් බස්නාහිර පළාතේ කර්මාන්ත, ව්‍යාපාර හෝ ස්වයං රැකියාවක් කරන හෝ ආරම්භ කිරීමට අපේක්ෂා කරන්නෙක් නම් ඔබ වෙනුවෙන්ම ක්‍රියාත්මක වන සේවාවන් ලබාගැනීම සඳහා බස්නාහිර පළාතේ කර්මාන්ත අධිකාරියේ ලියාපදිංචි වන්න.
ව්‍යවසායකයෙකු වශයෙන් හෙට දිනයේ මුළු ලොව ඉදිරියේ නැඟී සිටින්නට ඔබට අතහිත දෙන එකම ආයතනය බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය බව මා පවසන්නේ සාඩම්බරයෙන් යුතුවයි.

සාම විනිසුරු
**වඩුගේ සෝමසිරි ප්‍රනාන්දු**
සභාපති
මොරටුව දැව ආශ්‍රිත
කර්මාන්තකරුවන්ගේ සංගමය







Simplifying life with...

# Self Banking

## Visit your nearest People's Bank Self Banking Unit to experience convenient Banking.

### ATM — Automated Teller Machine...

- **Cash Withdrawal** (with card / without card)
- **Balance Inquiry**
- **PIN Change**
- **Mobile Cash Withdrawal** (without card)
- **Mini Statements**

VISA
lanka pay

### CDM — Cash Deposit Machine...

- **Cash Deposit** (with card / without card)
- **Bill Payment with Cash** (without card)
- **Balance Inquiry**
- **Mobile Reloads** (without card)
- **Mini Statements** (with card)

### KIOSK — Bill Payment Machine...

- **Fund Transfers** (People's Bank Accounts only)
- **Send Mobile Cash**
- **Mobile Reloads** (Dialog/Mobitel)
- **Mini Statements**
- **Balance Inquiry**
- **PIN Change**
- **Bill Payment with Card** (People's Bank VISA card holders only)
  - ✔ CEB Bills / LECO Bills
  - ✔ Water Board Bills
  - ✔ SLT Bills
  - ✔ Mobitel Bills
  - ✔ Dialog Mobile & TV Bills
  - ✔ Lanka Bell Bills



For more details call us on our hotline 1961 PEOPLE'S BANK CALL CENTRE

working towards CARBON CONSCIOUS certification

People's Bank is a licensed commercial bank supervised by the Central Bank of Sri Lanka.

PEOPLE'S BANK

www.peoplesbank.lk peoplesbanksrilanka

AA+ (lka) Fitch Rating, AA Brand Finance Rating




# පිරිවැය කළමනාකරණය සහ ව්‍යාපාර අරමුණු

ව්‍යාපාරිකයින්ගේ ව්‍යාපාර කටයුතු වලදී කළමනාකරණය කළ යුතු ප්‍රධාන සාධකය පිරිවැය කළමනාකරණය ලෙස හැඳින්විය හැකිය. ඊට හේතුව වන්නේ ව්‍යාපාරිකයන් විසින් බොහෝ විට සිදුකරනු ලබන්නේ පිරිවැය කළමනාකරණයට වඩා පිරිවැය කපාහැරීමයි. එම තත්ත්වය ව්‍යාපාරයේ ප්‍රධාන සංකල්පයට බෙහෙවින් බලපානු ලැබේ.

නිදසුන් වශයෙන් ගතහොත් ඔබ පන්දුවාර පනහේ ක්‍රිකට් තරගයක යෙදෙන අවස්ථාවකදී, ඔබගේ කණ්ඩායම පළමුව පන්දු යවන්නේ නම්, පන්දු යවන්නන් නිසි පරිදි කළමනාකරණය නොකරන්නේ නම්, ප්‍රතිවාදී පිළ විසින් ඔබට දැවැන්ත ඉලක්කයක් ලබාදෙනු ඇත. එවැනි අවස්ථාවකදී ඔබ කණ්ඩායමේ කොතරම් දක්ෂ පිතිකරුවන් සිටිය ද තරගය පරාජය වීමට ඉඩ ඇත. ඉන් අදහස් වන්නේ, කණ්ඩායමේ පන්දු යවන්නන් දුර්වල ලෙස කළමනාකරණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් දුර්වල පන්දු යැවීම සහ ප්‍රතිවාදීන් ඉහළ ලකුණු සංඛ්‍යාවක් ලබා ගැනීමත් අවසානයේ තරග කිරීමේ අවස්ථා සීමා වීම හේතුවෙන් තරගය පරාජය වීමත්ය.

මෙම පිරිවැය කළමනාකරණය කිරීමේ වැදගත්කම පහත උදාහරණ මගින් පැහැදිලි කරගත හැකිය.

## වැටුප් කළමනාකරණය

බොහෝ ආයතනවල කළමනාකාරිත්වයේ සහ ව්‍යාපාර හිමිකරුවන්ගේ කළමනාකරණ දුර්වලතා හේතුවෙන් එම ආයතනවල හොඳම සේවකයන් ආයතනයට අහිමි වේ. උදාහරණයක් වශයෙන් වසර 40ක නිෂ්පාදන ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති නිෂ්පාදන සුපරීක්ෂකවරයකුට කුඩා ප්‍රමාණයක හෝ වැටුප් වර්ධකයක් ලබා නොදීම හේතුවෙන් සිත්තැවුලට පත්ව වෙනත් තරගකාරී සමාගමක සේවයට බැඳී තමා සතු දැනුම එම ආයතනය වෙත ලබා දෙමින් ලාභලබන ආයතනයක් බවට පත් කිරීම කළ හැකිය. මේ නිසා පළමුව ආයතනයක දක්ෂ, විශ්වාසවන්ත සේවකයන් හඳුනා ගත යුතු අතර සේවකයන් ආයතන කෙරෙහි සෑහීමකට පත්කිරීමට වැටුප් වර්ධක පමණක් ලබාදීම නොකළ යුතුය. ඒ සඳහා වෙනත් උපාය මාර්ගික ප්‍රායෝගික ක්‍රම යොදා ගනිමින් ආයතනය තුළ අභ්‍යන්තර පාලනය හඳුනාගැනීම හා කළමනාකරණය වැදගත් වේ.

## සැපයුම්දාම කළමනාකරණය

බොහෝ ව්‍යාපාරිකයන්, පාරිභෝගිකයන් කළමනාකරණය කිරීමට ඇති සුදුසුම ක්‍රියාමාර්ගය ලෙස භාණ්ඩ තොග ලැයිස්තුවක් පවත්වාගෙන යාම තෝරාගෙන තිබේ. එහෙත් එය පරිපූරණ නොවන අතර සම්පූර්ණ සැපයුම්දාමය සාධනීයව හා කාර්යක්ෂමව කළමනාකරණය කළ යුතු වේ. එහිදී, පෙර නැඹුරුතාවයන් විශ්ලේෂණය කිරීම මගින් සහ ව්‍යාපාරික ඥානය උපයෝගී කොට ගනිමින්, පුරෝක්ෂණයන්ට එළඹීම තුළින් අවශ්‍ය තොග ප්‍රමාණය තීරණය කළයුතුය. බොහෝ ව්‍යාපාරිකයන් විසින් මෙය සිදු නොකරන නිසා තොග අවසන් වීම හෝ තොග අතිරික්තයක් පැවතීම සිදුවේ. මෙය පාරිභෝගිකයන්ට එතරම් යහපත් නොවේ. එහිදී ඇතැම්විට පූරක කාලය, බෙදා හැරීමේ කාලය, පෙර සැලසුම් නොකරන ලද අවිනිශ්චිතතාවයන් සහ තත්ත්ව පරීක්ෂාවන් පිළිබඳ සැලකිලිමත් නොවේ.

මීට උදාහරණයක් වශයෙන්, එක්තරා ප්‍රධාන පෙළේ ගෘහභාණ්ඩ සමාගමක් චීන වෙළෙඳ ප්‍රදර්ශනයකදී චීන සැපයුම් කරුවෙකුගෙන් භාණ්ඩ කන්ටේනරයක් ඇණවුම් කරන ලදී. මෙහිදී ඇණවුම් කරන ලද භාණ්ඩ ලැයිස්තුව නිසි වෙලාවට නිකුත් නොකිරීම නිසා ආනයනයේදී එහි මතුපිට හානි වී තිබිණ. මේ තත්ත්වය හේතුවෙන් භාණ්ඩ තොගය ප්‍රතික්ෂේප වීමෙන් සමාගමට පාඩු සිදුවිය. මෙම සිදුවීමට හේතුව සමාගම විසින් මෙම චීන වෙළෙඳ ප්‍රදර්ශනය සඳහා ක්ෂේත්‍රයේ අත්දැකීම් සහිත පුද්ගලයෙකු යැව්වද අමතර වියදමක් වූ චීන භාෂා පරිවර්තකයෙකු ගේ සේවය මේ සඳහා යොදා නොගන්නා ලදී.

## ඍජු පිරිවැය

ඍජු පිරිවැය කර්මාන්තයෙන් කර්මාන්තය හා ව්‍යවසායකයාගේ චින්තනය මත තීරණය වේ. උදාහරණයක් ලෙස යම් පුද්ගලයෙකු ප්‍රාදේශීයව සිදුකරන රසකැවිලි තොග ව්‍යාපාරයකදී වෙළෙඳ ප්‍රචාරණය සඳහා දරණ පිරිවැය

ඉතා අඩු වන නමුත් අන්තර් පුද්ගල සබඳතා පවත්වා ගැනීම මෙහිදී වැදගත් වේ. පාරිභෝගික සබඳතා ශක්තිමත් කිරීමටත්, පාරිභෝගික ජාලය ගොඩනගා ගැනීමටත් දරණ පිරිවැය මූල්‍යමය වශයෙන් ඵලදායී ද යන්න අධ්‍යයනය කිරීමට මෙම වියදම්වල සටහන් තැබීම වැදගත් වේ. එසේම ව්‍යාපාරිකයා ව්‍යාපාරයේ කළමනාකරුවන්ගේ ක්‍රියා පටිපාටි පිළිබඳ නිරන්තර අවධානයෙන් පසුවීම වැදගත් වේ. එය ව්‍යාපාරයේ අනවශ්‍ය පිරිවැය පාලනය කිරීම සඳහා බෙහෙවින් උපකාර වේ.

## පොදු පිරිවැය

පොදු පිරිවැය මනාව සැලසුම් කළ යුතු වේ. ප්‍රධාන පොදු පිරිවැය ලෙස විදුලිය, ජලය, ලිපිද්‍රව්‍ය, දෛනික වැටුප්, ගොඩනැගිලි පිරිවැය, සේවක සුභසාධනය වැනි දෑ ගත හැකිය. මෙම පොදු පිරිවැය කර්මාන්තයෙන් කර්මාන්තයට වෙනස් වේ.

මෙම පිරිවැය පාලනයේ මූලික ක්‍රමවේදය ලෙස බිල්පත් පරීක්ෂා කිරීම, අවභාවිතය පාලනය කිරීම යනාදිය ගත හැකිය. මෙය සේවකයන්ගේ අභිප්‍රේරණයට ගැටළුවක් නොවන පරිදි සූක්ෂමව සිදු කළ යුතුය. ප්‍රායෝගික උදාහරණ කිහිපයක් හඳුනාගත හැකිය. ඒවා අතර, විදුලි බිල පාලනය ඉතා වැදගත් වේ. වර්තමානයේදී ව්‍යාපාරිකයන්ට සලකා බැලිය හැකි විකල්ප කිහිපයකි. එහිදී සූර්ය බලශක්තිය යොදා ගැනීමත් ඉන් අමතර ආදායමක් ඉපයීමටත් හැකියාව ඇත. එසේම විදුලි බිල අවම වන පරිදි යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම ද පවතින විදුලි උපකරණ විදුලිය ඉතිරි කරන මාදිලියෙන් තෝරා ගැනීම ද කළ හැකිය.

(Inventor වායු සමීකරණ)

## ලිපිද්‍රව්‍ය වියදම්

ආයතනයකට අඩු ප්‍රාග්ධන වියදමකින් තමන්ගේ අවශ්‍ය උපකරණ ලබාගෙන, ලිපිද්‍රව්‍ය වියදම් පාලනය කරගැනීම සඳහා විවිධ උපක්‍රම භාවිතා කළ හැකිය. එහිදී උදාහරණයක් ලෙස පරිහරණයේදී එක් එක් පුද්ගලයාට වෙන වෙනම කේතක (code) යොදා photocopy machine එක ප්‍රයෝජනයට ගතහැකිය. එසේම නව ව්‍යාපාරයකට කුලී පදනම මත මෙවැනි උපකරණ ලබාදීමට විවිධ ආයතන පවතී.

කෙසේ වුවද වර්තමානයේදී තාක්ෂණය මුසුවී ඇති බැවින් පිරිවැය පාලනය කරගැනීම සඳහා විවිධ උපක්‍රම ඇති බව කිව යුතුය.



**ලසන්ත වීරසිංහ**

ACMA, MBS (University of Colombo) bSc- Finance (Sp) USJP

Information Technology Resources Development Authority WP

BEST WISHES from

ITRDA

Sri sangaraja Mawatha Colombo 10

Tel: 0112 231123/25 Fax: 011 2381122

www. itrda. wp.gov. lk

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සේවක ගැටළුව විසඳීමට

# මානව සම්පත් කළමනාකරණය

ශ්‍රී ලංකා ආර්ථිකයේ සමස්ථ ව්‍යාපාර ව්‍යුහයෙන් 80% ක් පමණ වනුයේ සුළු හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තයන්ය. මින් පිළිබිඹු වනුයේ ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටකට මෙවැනි කුඩා ව්‍යාපාර සිය ආර්ථික සංවර්ධනයක් සඳහා වැඩි දායකත්වයක් ලබා දෙන බවයි. කුඩා පරිමාණයේ ව්‍යාපාර බොහොමයක් මූලිකත්වය ලබා දෙනුයේ ගිණුම්කරණය, මූල්‍ය පාලනය, නිෂ්පාදනය හා අළෙවිකරණය යන අංශවලටයි. මේ සඳහා බලපානු ලබන ප්‍රධාන හේතුව වනුයේ සංවිධානය තුළ පුද්ගලයින් කිහිපදෙනෙකු පමණක් සිටින නිසාය. කෙසේ වෙතත් මහා පරිමාණයේ මෙන්ම කුඩා පරිමාණයේ ආයතනවල දෛනික කාර්යයන් සිදු කිරීම සඳහා පොදුවේ මානව බලය අවශ්‍ය වේ.

කාර්මික වශයෙන් දියුණු මෙන්ම දියුණු වෙමින් පවතින රටවලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය ඉතාමත් ප්‍රචලිතය. මේ වන විට ශ්‍රී ලංකාවේ ආර්ථිකයට විශාල දායකත්වයක් සපයන එහෙත් සාධනීය ගණනයක් කර නැති සුළු පරිමාණ කර්මාන්ත බොහෝමයක් රට තුළ ව්‍යාප්ත වී ඇත. මෙවැනි ව්‍යාපාර රටේ සංවර්ධනය සඳහා සෘජු සම්බන්ධතාවයක් ලබා ගැනීම ඉතා යෝග්‍ය වේ.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල පහත දැක්වෙන ගති ලක්ෂණ දක්නට ලැබේ.

**ව්‍යාපාරයේ කළමනාකරණය ස්වාධීන වීම.**

බොහෝ විට අයිතිකරුවාම කළමනාකරුවාද වේ.

තනි පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් ප්‍රාග්ධනය යොදති. ඔවුහු අයිතිකරුවෝද වෙති.

ක්‍රියාකාරී ව්‍යාපාර ක්ෂේත්‍රය බොහෝ විට දේශීය වේ. නමුත් වෙළඳපල දේශීය නොවිය හැකිය. සේවකයන් හා අයිතිකරුවන් එකම ප්‍රජාවකට අයත් වේ.

කර්මාන්තයේ නියුක්ත වෙනත් ආයතනවලට සාපේක්ෂව මෙය කුඩාය.

මෙම මිණුම විකුණුම් ප්‍රමාණය මත, සේවක සංඛ්‍යාව මත හෝ වෙනත් නිර්ණායකයන් මත විය හැකිය.

විශාල ව්‍යාපාරවලට සාපේක්ෂව මේවායේ මූල්‍ය බැඳීම අඩුය. බදු ගෙවීමේදී අඩු බදු ප්‍රතිශතයකට හිමිකම් කියයි.

දැනට රට තුළ පවතින සුළු කර්මාන්ත සඳහා ගැටළු රාශියක් ඇති නමුත් ප්‍රධාන කාරණාවක් වී ඇත්තේ එම කර්මාන්ත පවත්වාගෙන යාම සඳහා ඇති සේවක ඌණතාවය බව ඔවුන් විසින් සඳහන් කරනු ලබයි. මෙය එක් අංශයකින් සත්‍ය වුවද බොහෝ ව්‍යාපාරවල දක්නට ලැබෙන මානව සම්පත් කළමනාකරණයේ දුර්වලතාවය සෘජුව මේ ගැටළුව සඳහා බලපා ඇති බව පෙනී යයි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අඩු සේවක සංඛ්‍යාවක් සිටින බැවින් බොහෝ විට මානව සම්පත් කළමනාකරණ කටයුතු සිදුවන්නේ අවිධිමත් ලෙසටය. විශේෂිතව මානව සම්පත් කළමනාකරණ අංශයක් හෝ මානව සම්පත් කළමනාකරුවෙකු පත් කිරීමට බොහෝ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මැළිකමක් දක්වයි. ඒ නිසා බොහෝ විට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල මානව සම්පත් කළමනාකරණය සිදුවන්නේ එහි අයිතිකරුගේ අභිමතය පරිදිය.

පසුගිය වසර 03 ක කාලයක සිට මෙම ක්ෂේත්‍රය මුහුණ දුන් ප්‍රධානතම ගැටළුව වනුයේ කෙටි කලක් තුළ බොහොමයක් ව්‍යාපාර බංකොලොත් වීමයි. එබැවින් මෙම ක්ෂේත්‍රයේ වර්ධනයක් අපට දැක ගැනීමට නොහැකි විය.

මෙයට ප්‍රධාන හේතුව ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවිධානවල ආයු කාලය කෙටි වීම දැක්විය හැකිය. මෙසේ ආයු කාලය කෙටි වීමට හේතුව වනුයේ, තත්ත්වයෙන් බාල නිෂ්පාදිතයන්, පුහුණු ශ්‍රමිකයන්ගේ දායකත්වය අඩුවීම, රාජ්‍ය ප්‍රතිපත්ති, සුළු වෙළඳපල අවස්ථා, මූල්‍ය දුෂ්කරතා, යෙදවුම් සොයා ගැනීමේ දුෂ්කරතා, ඇඩ් තරගකාරිත්වය, අති විශාල ආදේශකයන් තිබීම යනාදිය දැක්විය හැකිය. මෙහි සඳහන් බොහොමයක් හේතූන් මානව සම්පත් කළමනාකරණය හා සම්බන්ධ වී ඇත. එසේම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ද තම නිසි අවධානය මානව සම්පත් කළමනාකරණය සඳහා යොමු නොකරයි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් මුහුණ දෙන ප්‍රධානතම ගැටලුවක් ලෙස පුහුණු ශ්‍රමිකයන් ආයතනය තුළ රඳවා ගැනීමට ඇති දුෂ්කරතාව රජය

විසින් හඳුනාගෙන ඇත. ඒ සඳහා ගත හැකි ප්‍රධානතම උපාය මාර්ගයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා අවශ්‍ය වන නිසි පුහුණු ශ්‍රමිකයන් පිරිසක් රට තුළ නිර්මාණය කිරීමත්, නිසි ක්‍රමවේදයක් යටතේ තම සේවකයන් ආකර්ෂණය කරගැනීමත් තෝරා ගැනීම හා බඳවා ගැනීමේ අවශ්‍යතාවයන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයා දැනුවත් කිරීමත් ඒ සඳහා තම සහයෝගය ලබා දීමටත් යෝජනා වී ඇත.



**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අඩු සේවක සංඛ්‍යාවක් සිටින බැවින් බොහෝ විට මානව සම්පත් කළමනාකරණ කටයුතු සිදුවන්නේ අවිධිමත් ලෙසටය. විශේෂිතව මානව සම්පත් කළ මනාකරණ අංශයක් හෝ මානව සම්පත් කළමනාකරුවෙකු පත් කිරීමට බොහෝ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මැලිකමක් දක්වයි.**

- පරිපාලනමය ගැටළු සාධරණ ලෙස විසඳා ගැනීමට අවශ්‍ය වන සේවක විනය හා සේවකයන් ඉවත් කිරීමේ ක්‍රමවේදයන් භාවිතය සඳහා ව්‍යවසායකයන්ට අවශ්‍ය වන නීති රාමුව සකසා දීම.

- පුද්ගල හැකියාව, ව්‍යාපාරික අවශ්‍යතා මත රැකියා නිර්මාණය කිරීමේ අවශතාව හා වැදගත්කම සම්බන්ධයෙන් ව්‍යාපාරිකයන් දැනුවත් කිරීම හා ඒ සඳහා අවශ්‍ය වන සහයෝගය ලබාදීමටද කටයුතු කරයි.

- දැනුම මත පදනම් වූ ආර්ථික ක්‍රමවේදයක් තුළ අධ්‍යාපනය හා පුහුණුව සඳහා වන අවශ්‍යතාව ව්‍යවසායකයින්ට පහදා දීම හා ඒ සඳහා ගතහැකි ක්‍රියාමාර්ගයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවිධාන වලටම ආවේණික වූ නව පුහුණු ක්‍රමවේදයක් හඳුන්වාදීම.

- සෑම පුද්ගලයෙකුම තොරතුරු දැනගැනීමේ අවශ්‍යතාව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයා හට පහදා දීම හා එමඟින් වඩාත් ශක්තිමත් සේවක, සේව්‍ය සබඳතා ඇති කර ගැනීමට ඔවුන් දිරිගැන්වීම.

- සේවක සෞඛ්‍ය හා ආරක්ෂණය සම්බන්ධව සැළකිලිමත් වීමේ අවශ්‍යතාව ඔවුනට පහදා දීම හා ඒ සඳහා ඇති නීති රාමුව වඩාත් ශක්තිමත් කිරීම.

මෙවැනි ක්‍රියාමාර්ග භාවිතයෙන් ශ්‍රී ලාංකේය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යපාර සංවිධාන ක්‍රමවත් මානව සම්පත් කළමනාකරණ භාවිතයන් සඳහා යොමු කිරීමට ශ්‍රී ලංකා රජය විසින් අනාගතයේදී අපේක්ෂා කරයි. එමඟින් ශ්‍රී ලාංකීය ආර්ථිකයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මඟින් ලබාදෙන්නා වූ දායකත්වය ඉහළ නැංවීම ඔවුන්ගේ අනාගත අපේක්ෂාවන් අතර වේ.

ශ්‍රී ලාංකීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවිධානයන් මානව සම්පත් කළමනාකරණ භාවිතය ගැන සළකා බලන කල්හි, එහි භාවිතය ඉතා අඩු මට්ටමක පවතින අතර, අවිධිමත් භාවිතයන් ද දැකිය හැක. එයට බලපාන ප්‍රධාන හේතුව ලෙස තාක්ෂණය, මහා මාර්ග පද්ධතිය, මූල්‍ය වෙළඳපල, ශ්‍රමික වෙළඳපොල තුළ පවත්නා ගැටළු දැක්විය හැක. එසේම බොහෝමයක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවිධාන මුහුණ දෙන ගැටලුවක් ලෙස අවිධිමත් සංස්කෘතිය හඳුන්වාදිය හැක.

එසේම ආයතනයක් ලෙස ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන්නා වූ අරමුණු සුළුවීමත්, ආයතන තුළ පවත්නා නම්‍යශීලී භාවයත්, ක්‍රමවත් ලෙස සකස් වූ රැකියා නොතිබීමත්, සපුරාලිය යුතු නීත්‍යානුකූල අවශ්‍යතා ප්‍රමාණය සීමාවීමත් යනාදී කරුණු අවිධිමත් මානව සම්පත් කළමනාකරණ භාවිතයන් සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවිධාන යොමුවීම හඳුන්වාදිය හැකිය. මෙමගින් අපට නිගමනය කළ හැකි කරුණු වනුයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවිධාන රටක ආර්ථික වර්ධනයට විශාල දායකත්වයක් ලබාදෙන අතර, මානව සම්පත් කළ මනාකරණ භාවිතයන් සාර්ථක ලෙස යොදා ගැනීම මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්හි කාර්යක්ෂම භාවිතය සඳහා උපයෝජනය කළ හැකි බවයි.




**ශ්‍රීමාල් ජයතිලක**
BSc HNDE
Diputy Director
Industrial development Board
District Office- Gampaha

# වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය

ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය බස්නාහිර පළාත් සභාව
ඔබත් ශක්තිමත් ආරක්ෂක සේවයක සාඩම්බර කොටස්කරුවෙකු වන්න

## කොළඹ , ගම්පහ , කළුතර දිස්ත්‍රික්කයන්හි
## ආරක්ෂක පුරප්පාඩු සඳහා
## වහාම බඳවා ගැනීම් සිදු කෙරේ.

**ඔබ**

- අවු 18ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද ,
- උස අඩි 5 අඟල් 6ට වැඩි මනා පෞරෂයකින් යුත් අයෙක් ද ,
- උස අඩි 5 අඟල් 2ට වැඩි කාන්තාවක් ද ,
- ලිවීමට කියවීමට හැකි 8 ශ්‍රේණිය සමත් අයෙක්..

**අපෙන් ඔබට**

- රෝහල් හා කායිකල ආරක්ෂක නිළධාරීන් ලෙස පත්වීමක්
- රජයේ අනුමත වැටුප නව වැඩිකිරීම් සමඟ දීමනා
- සෑම මසක 10 වැනි දිනට වැටුප් හා 25 වැනි දිනට රු 5,000/-ක වැටුප් අත්තිකාරම්
- නියමිත දිනට ETF/EPFතැන්පත් කිරීම
- රෝහල් ගත විමකදී දිනකට රු 1500/- බැගින් ලබා දී ඔබේ පවුලේද ආර්ථිකය ශක්තිමත් කිරීම
- හදිසි වියෝවකදී ඔබේ සේවය අහිමි වන යැපෙන්නන්ට වසර 05 ක් මාසිකව රු : 20,000/-ක දීමනාවක් ලබා දීම.



**විමසීම්**
කොළඹ - 071 - 449 7818
කළුතර - 071 - 232 1426
ගම්පහ - 071 - 561 0591

වහාම සහතික රැගෙන පහත ලිපිනයට පැමිණෙන්න..

**වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය**
ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය ( බ.ප )
බාරෝන් ජයතිලක විද්‍යාල පරිශ්‍රය, මාලිගාවත්ත, කොළඹ 10.
දුරකථන අංක : 011 - 244 5303 , 011 - 244 8430 , 077 - 301 1248

# D.S කොන්ක්‍රීට් වර්ක්ස්



ළිං වලළු
සෙප්ටික් ටැංකි
බිමු ඇතිරුම් ගල්
හියුම් පයිප්ප
කම්බි කණු

උළුවහු / ජනෙල්
ආලින්ද කුළුණු
පිකට් වැට, බ්ලොක් ගල්
ඇතුලු සියලුම කොන්ක්‍රීට් නිෂ්පාදන

341/13 පොසොන් වත්ත පාර වනවාසල
කැලණිය

07766 10709 07777 803200

# ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය

## මගින්

# ව්‍යවසායක ඔබට ලැබෙන අත්වැල



1964 අංක 38 දරණ ලංකා ප්‍රමිති කාර්යාංශය පනත යටතේ ස්ථාපිත වූ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මෙරට කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයන් වෙනුවෙන් විශාල සේවාවක් ඉටුකරනු ලබන ආයතනයක් වශයෙන් හඳුනාගත හැකිය. මුල් කාලයේදී ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය නමින් ක්‍රියාත්මක වූ මෙම ආයතනය දැනට විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පාලනය වේ.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් වෙත ඔවුන්ගේ නිෂ්පාදන දිරිගැන්වීම උදෙසා අතහිත දෙමින් විශාල කාර්යභාරයක් ඉටු කරන අතර එහිදී, ප්‍රධාන තාක්ෂණික අංශ 7ක් යටතේ ඔවුන්ගේ සේවාවන් ක්‍රියාත්මක කරයි. මෙම සේවාවන් සැපයීම සඳහා ඒ උදෙසාම කැපවූ තුන්සියයකට අධික නිලධාරී මඬුල්ලක් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සතුවීම නිසා ව්‍යවසායක ඔබට ඉතා පහසුවෙන් මෙම සේවාවන් ලබාගැනීමේ හැකියාව පවතී.

මෙම සේවා සැපයීමේ ප්‍රධාන තාක්ෂණික අංශ ලෙස ප්‍රමිතිකරණ අංශය
ප්‍රලේඛන හා තොරතුරු ලබාදීමේ අංශය (පුස්තකාලය)
පරීක්ෂණාගාර අංශය
මිණුම් උපකරණ ක්‍රමාංකනය කිරීමේ අංශය
පද්ධති සහතිකකරණ අංශය
භාණ්ඩ සහතිකකරණ අංශය
පුහුණු කිරීමේ අංශය යනාදිය හඳුනාගත හැකිය.

### ප්‍රමිතිකරණ අංශය

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ මූලිකම කාර්යභාරය වන ජාතික ප්‍රමිති කෙටුම්පත් සම්පාදනය කිරීමේ වගකීම මෙම අංශයට පැවරී තිබේ. ඒ ඒ විෂය ක්ෂේත්‍රයට අදාළව පිහිටුවාගත් තාක්ෂණික කමිටුවල උපදෙස් හා මග පෙන්වීම යටතේ මෙය සිදුකරන අතර වෘත්තීය සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයක් මෙම කමිටු කළමනාකරණය කරනු ලැබේ.

භාණ්ඩ සඳහා, නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා, භාවිත සංග්‍රහයක් සඳහා තත්ත්ව පාලන පද්ධති සඳහා, පරීක්ෂණ ක්‍රමවේද සඳහා යනාදී වශයෙන් 500කට අධික ප්‍රමාණයක් මෙම අංශය මඟින් සම්පාදනය කොට තිබේ. එහිදී යම්කිසි භාණ්ඩයක් සඳහා සැකසූ ප්‍රමිති කෙටුම්පත තුළ එම භාණ්ඩය මගින් පාරිභෝගික ආරක්ෂාව සපුරාලීමට වැදගත් වන අවම වශයෙන් සැපිරිය යුතු අවශ්‍යතාවයන් කවරේද යන්න ද ලේබලයෙහි අඩංගු කළ යුතු තොරතුරු පිළිබඳව ද සඳහන් කර තිබේ.

**ආර්ථිකයෙහි සියලු අංශවල තත්ව සහතික කිරීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීමේදී මෙම අංශය මඟින් වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලැබේ. මෙමගින් හඳුන්වාදී ඇති යහපත් නිෂ්පාදන පිළිවෙත් සඳහා වන සහතිකකරණය (ජී එම් පී සහතිකකරණය) සුවිශේෂී වේ. එය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන උසස් තත්වයෙන් නිමවා ඇති බව තහවුරු කිරීම සඳහා උපයෝගී කරගන්නා සහතිකකරණයකි.**

ව්‍යවසායක ඔබ නිෂ්පාදනය කරන භාණ්ඩය අදාළ ප්‍රමිති කෙටුම්පත ප්‍රකාශයට පත්කර ඇත්දැයි නිවැරදිව

හඳුනාගෙන එහි ගුණාංගයන්ට අනුකූලව භාණ්ඩය නිෂ්පාදනය කර වෙළඳපලට නිකුත් කිරීම මගින් වෙළඳපලේ පාරිභෝගික විශ්වාසය ද ඔබට තහවුරු කරගත හැකිය.

### ප්‍රලේඛන හා තොරතුරු ලබාදීමේ අංශය (පුස්තකාලය)

ජාතික හා අන්තර්ජාතික ප්‍රමිතීන් පිළිබඳව සහ ශ්‍රී ලංකාවේ විවිධ ආයතන විසින් හඳුන්වා දී ඇති වලංගු රෙගුලාසි සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු මෙම අංශය මගින් ලබාගත හැකිය. අවශ්‍ය නම් ජාතික හා අන්තර්ජාතික ප්‍රමිති කෙටුම්පත් මිලදී ගැනීමේ හැකියාව ද මෙහිදී පවතී. එසේම මෙම අංශය තුළ ඇති පොත්පත් නොමිලේ පරිහරණය කිරීමේ පහසුකම ද ඔබට සලසා තිබීම සුවිශේෂී වේ.

### පරීක්ෂණාගාර අංශය

ව්‍යවසායක ඔබ විසින් නිෂ්පාදය කරන ලද භාණ්ඩවල තත්ත්වය අදාළ ප්‍රමිති පිරිවිතරයේ පෙන්වා දී ඇති අවශ්‍යතාවන්ට අනුකූල වන්නේ දැයි මෙම අංශය මගින් පරීක්ෂාවට ලක් කරගත හැකිය. එහිදී ද්‍රව්‍ය, විදුලි, රසායනික, රෙදිපිළි, ආහාර හා ක්ෂුද්‍රජීවී පරීක්ෂණ කටයුතු සිදුකර ගැනීමේ හැකියාව පවතී.

### මිණුම් උපකරණ ක්‍රමාංකනය කිරීමේ අයිතිය.

නිෂ්පාදන ක්‍රියාවලියේදී සිදුවන දෝෂ මගහරවා ගනිමින් නිෂ්පාදන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව සිදුකර ගැනීමට නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිත කරනු ලබන මිණුම් උපකරණයන්හි පාඨාංකයන්හි නිරවද්‍ය භාවය තහවුරු කරගත යුතුය. එකී මිණුම් උපකරණයන්හි නිරවද්‍ය භාවය පරීක්ෂා කිරීම මෙම අංශයෙන් සිදුවන අතර මෙමගින් භාණ්ඩයේ තත්ත්වය අදාළ ප්‍රමිතීන්ට අනුකූලව නිපදවා ගැනීමේ හැකියාව පවතී. එය ව්‍යවසායක ඔබගේ නිෂ්පාදනයේ ගුණාත්මකභාවය කෙරෙහි ද විශේෂයෙන් බලපානු ලැබේ.

### පද්ධති සහතිකකරණ අංශය

ආර්ථිකයෙහි සියලු අංශවල තත්ත්ව සහතික කිරීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීමේදී මෙම අංශය මගින් වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලැබේ. මෙමගින් හඳුන්වාදී ඇති යහපත් නිෂ්පාදන පිළිවෙත් සඳහා වන සහතිකකරණය (ජී එම් පී සහතිකකරණය) සුවිශේෂී වේ. එය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන උසස් තත්ත්වයෙන් නිමවා ඇති බව තහවුරු කිරීම සඳහා උපයෝගී කරගන්නා සහතිකකරණයකි.

උදාහරණයක් ලෙස ගතහොත් ආහාර නිෂ්පාදනය කරන ආයතනයක එම ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීමේ සිට නිමි භාණ්ඩය සැකසීම දක්වා සිදු කරන සියලුම ක්‍රියාවලීන් SLS 143 දරණ යහපත් සෞඛ්‍යාරක්ෂිත පිළිවෙත් සඳහා වන භාවිත සංග්‍රහයේ සඳහන් ක්‍රියාමාර්ග වලට අනුකූලව නිපදවා ඇති බවට තුන්වන පාර්ශ්වයක් ලෙස ප්‍රමිති ආයතනය තහවුරු කරයි. එය තරඟකාරී වෙළඳපල තුළ පාරිභෝගික විශ්වාසය දිනා ගනිමින් සාර්ථකව රැඳී සිටීමට උපකාරීවේ. එසේම මෙම GMP සහතිකකරණය ලබාගැනීම, අනෙකුත් ජාත්‍යන්තර මට්ටමේ පිළිගැනීමක් ඇති ISO 9001, ISO 22000, HACAP වැනි සහතිකකරණ ලබා ගැනීමට ද මග පෙන්වන එක් මූලික පියවරකි.

මෙම සහතිකකරණය සිදුකළ හැකි විෂය ක්ෂේත්‍ර (භාවිත සංග්‍රහ සහ ප්‍රමිතීන් ) ලෙස ආහාර වර්ග සහ පාන වර්ග නිෂ්පාදනය සපයන නිෂ්පාදනය සිදුකරන, සැකසුම් කරන ආයතන, ආහාර ඇසුරුම්කරණය, විලවුන් හා දේශීය ඖෂධ නිෂ්පාදන, කොහු, කෙඳි හා කොහුබත් උපස්ථර නිෂ්පාදන, පිරිසිදුකාරක, දැව, ඇන්තූරියම්, ඕකිඩ් හා බුලත් අස්වනු නෙළීම හා සැකසීම, ඇසුරුම් කරන ලද පොහොර සැකසීම හා ගබඩා කිරීම, ජීව වායු පද්ධති නිර්මාණය කිරීම හා ඉදිකිරීම, ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණය කිරීම ආදිය සඳහන් කළ හැකිය.

### භාණ්ඩ සහතිකකරණ අංශය

ප්‍රමිති කෙටුම්පතක් ඇති භාණ්ඩ සඳහා භාණ්ඩ සහතිකකරණය හෙවත් SLS සහතික ලාංඡනය ලබාදීම මෙම අංශය මගින් සිදුවේ. ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතරයට සඳහන් වන අවශ්‍යතාවලට අනුකූලව භාණ්ඩ නිපදවා ඇති බවට මෙම සහතිකය මගින් තහවුරු කරනු ලැබේ . එහිදී ව්‍යවසායක ඔබට භාණ්ඩය මත මෙම SLS ලාංඡනය ප්‍රදර්ශනය කිරීමේ අයිතිය හිමිවේ. මෙම SLS ලාංඡනය ලබාදීමට පෙර අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුදු විගණක කණ්ඩායමක් විසින් ආයතනය තුළ වෙළඳපලෙන් ලබා ගන්නා නියැදීන් පරීක්ෂාවට ලක් කිරීම සිදුකරනු ලැබේ. තවද මෙම SLS ලාංඡනය ලබාගැනීම ස්වේච්ඡාවෙන් ලබාගත යුතු සහතිකයක් වුවද පාරිභෝගික ආරක්ෂක පනත යටතේ අත්‍යවශ්‍ය භාණ්ඩ 42 ක් සඳහා SLS ලාංඡනය ලබාගැනීම අනිවාර්යකර තිබේ. SLS සහතිකය ලබා නොගත් භාණ්ඩ සමඟ තරඟ කර ඔබගේ නිෂ්පාදනයේ ගුණාත්මකභාවය රැකගැනීමටත් පාරිභෝගික විශ්වාසය තහවුරු කරගැනීමටත් මෙමගින් ඔබට හැකියාව ලැබේ.

### පුහුණු කිරීමේ අංශය

සහතික කරන ක්‍රමවේදය හෝ තත්ත්වය පිළිබඳව දැනුම හා තොරතුරු ලබාගැනීමට අවශ්‍ය නම් මෙම පුහුණු කිරීමේ අංශය මගින් එම තොරතුරු ලබාගැනීමේ හැකියාව පවතී. මෙහිදී මෙම අංශය මගින් පුහුණු පාඨමාලා පවත්වන අතර එම පාඨමාලා පිළිබඳව වැඩිදුර තොරතුරු ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වෙබ් අඩවිය හරහා ලබාගත හැකිය.

විමසීම්
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
නො.17 වික්ටෝරියා පෙදෙස
ඇල්විටිගල මාවත
කොළඹ 07

**මාලා වී. තෙන්නකෝන්**
ජ්‍යේ. නියෝජ්‍ය අධ්‍යක්ෂිකා
ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ ආයතනය

# කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ වියපත් දිවියට

# විශ්‍රාම වැටුප් රැකවරණය



කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය සැළකීමේ දී එමගින් ජාතික ආර්ථිකයට ලැබෙනුයේ සැළකිය යුතු දායකත්වයකි. මෙම ඉලක්කගත කණ්ඩායමෙන් වැඩි පිරිසක් කුඩා පරිමාණ ව්‍යවසායකයින් වන අතර, මොවුන්ගේ රැකියාව මෙන්ම ජීවන රටාව අනුව දෛනික ඉපයීම් වලින් සැළකිය යුතු ප්‍රතිශතයක් දෛනික වියදම් බවට පත්වීම නොවැලැක්විය හැකි සංසිද්ධියකි. එසේ හෙයින් මොවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීම ඉලක්ක ගත කර ව්‍යාපාර වැඩිදියුණු කිරීමට අවශ්‍ය දායකත්වය මෙන්ම දැනුමින් පරිණත කිරීම සඳහා රාජ්‍ය ආයතන ජාලය හා ඒකාබද්ධව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

පසුගිය දශක දෙක තුළ ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනයේ සැළකිය යුතු වර්ධනයක් පෙන් වූ අතර, වර්ෂ 2012 දී 12% ක් වූ වර්ධන ප්‍රතිශතය වර්ෂ 2030 දී 22% ක් පමණ විය හැකි බවට පුරෝකථනය කර ඇත. මෙවන් වපසරියක් තුළ මෙම ඉලක්කගත කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨ පුරවැසි සමය සුරක්ෂිත කිරීම සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක අවශ්‍යතාවය දැඩිව පැනනැගී ඇත. මෙම තත්ත්වය සැළකිල්ලට ගෙන බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ඒකාබද්ධව සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇත.

1999 අංක 33 දරණ පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා ආරක්ෂණ මණ්ඩලය සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙමින් රාජ්‍ය විශ්‍රාම වැටුප් හිමිකම් නොමැති ලොකු පොඩි සැමට රාජ්‍ය වගකීම් සහිත විශ්‍රාම වැටුප් ක්‍රම හඳුන්වා දෙන ලදී. වසර දහනමයක් පුරාවට රාජ්‍ය ආයතන ජාලය සමග එක්ව විවිධ ක්ෂේත්‍රවල සේවා නියුක්තිකයින් 25,000කට ආසන්න සංඛ්‍යාවක් සඳහා මාසික විශ්‍රාම වැටුප් ලබාදෙමින් නිහඬ සේවාවක් ඉටුකර ඇත. ඒ අනුව සමාජ ආරක්ෂණ මණ්ඩලය මගින් වර්තමානයේ ක්‍රියාත්මක කරනු ලබන විශ්‍රාම වැටුප් සැලසුම් දෙකකි.

## 'සුරැකුම' විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

දායකත්වය ලබාගැනීමට අවශ්‍ය සුදුසුකම්

- වයස අවුරුදු 18 - 59
- වෙනත් රාජ්‍ය විශ්‍රාම වැටුපකින් ආවරණය නොවන පුද්ගලයෙකු වීම

ලබාදෙන ප්‍රතිලාභ

- වයස අවුරුදු 60 සිට ජීවිතාන්තය දක්වා මාසික විශ්‍රාම වැටුප
- දායකයා අවුරුදු 80 පෙර මියගියහොත් කාලත්‍රය සඳහා දායකයාගේ අවුරුදු 80 තෙක් මාසික විශ්‍රාම වැටුප
- අර්ධ අබලතා ප්‍රතිලාභ
- පූර්ණ අබලතා ප්‍රතිලාභ
- මරණ පාරිතෝෂිත

## 'ආරස්සාව' පූර්ව විශ්‍රාම වැටුප් සැලසුම

වයස අවුරුදු 18 අඩු දරුවන් සඳහා ක්‍රියාත්මක කරයි දෙමව්පියන් හෝ භාරකරුගේ භාරකාරත්වය යටතේ වයස අවුරුදු 18 දක්වා ක්‍රියාත්මක වන 'ආරස්සාව' සමාජ ආරක්ෂණ හිමිකම වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු දරුවා නමින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ එකවර වාරික ගෙවීමේ ක්‍රමවේදය මත අදාළ සාමාජිකත්වයට මාරුකරනු ලැබේ.

ප්‍රතිලාභ

- 5 වසර ශිෂ්‍යත්ව
- අ.පො.ස. සාමාන්‍ය පෙළ හා අ.පො.ස. උසස් පෙළ විභාග සමත් වීමේදී විශේෂ ප්‍රතිලාභ
- වයස අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් පසු ප්‍රතිලාභ
- වයස අවුරුදු 60 සිට ජීවිතාන්තය දක්වා මාසික විශ්‍රාම වැටුප
- දායකයා අවුරුදු 80 ට පෙර මියගියහොත් කාලත්‍රයා සඳහා දායකයාගේ වයස අවුරුදු 80 තෙක් මාසික විශ්‍රාම වැටුප
- අර්ධ අබලතා ප්‍රතිලාභ
- පූර්ණ අබලතා ප්‍රතිලාභ
- මරණ පාරිතෝෂිත

### සාමාජිකත්වය ලබා ගැනීම

බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් මගින්...

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල ප්‍රධාන කාර්යාලයෙන්... පහත ලිපිනයන්ගෙන් හෝ දුරකථන අංක මගින් විමසීම් කළ හැක.

### ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

අංක 18
"සමාජ ආරක්ෂණ පියස"
රාජගිරිය පාර, රාජගිරිය
දුරකථනය 011-2886088

### බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

නො. 4A 1/1, සෝරත මාවත
ගංගොඩවිල, නුගේගොඩ
දුරකථන 011-5515570
011-5015559

**ඉන්දික ජයසිංහ**
*Manager (Promotion)*
*Sri Lanka Social Security Board*


TORENTO
ENGINEERING
MANUFACTURES OF INDUSTRIAL MACHINERY & E - VEHICLES
SHOE MACHINERY
GARMENT MACHINERY
HYDRAULIC CUTTING MACHINES
HEAT TRANSFER MACHINES
BRA CUP MOLDING MACHINES
CUTTING DIES
INDUSTRIAL OVENS ETC...
TORENTO PNEUMATICS
TORENTO E-VEHICLES FOR
HOTELS, FARMS, PARKS, BEACH, GARMNETS, FACTORYS
MINI TRUCK
PASSENGER CART
MINI TRUCK WITH CABIN
PASSENGER CARRIER
TIPPER TRUCK
Office/factory : No.2A, Weboda East, Weboda Sri Lanka
Tel - Fax : +94112972433, +94 11 5670231, +9411 4381312
E- mail : info@torento.biz Web : www.torento.biz


W.P.-R.P.T.A
සුභ පැතුම්
මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය - බස්නාහිර පළාත
வீதிப்பயணிப் போக்குவரத்து அதிகார சபை -மேல் மாகாணம்
Road Passenger Transport Authority - Western Province
අංක.89 'රන්මගපාය'
කඩුවෙල පාර,
බත්තරමුල්ල.
Tel : 0112 887 872
Fax : 0112 864 544
Web : www.rpta.wp.gov.lk

# ගමන පුරාවට පවතින ආරක්ෂාව



ජාතියේ රථවාහන රක්ෂණ සහකරු සෑම පියවරක් පාසාම ඔබත් සමග සිටින නිසා සැමදාම බියක් නැතිව ඔබගේ ගමන්වල යෙදෙමින් ජීවිත ගමන උපරිමයෙන් විඳින්න. පරම්පරා ගණනක් තිස්සේ ගොඩනැගුනු විශ්වාසය සමග ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් ඔබට ආරක්ෂාව සහ සන්සුන් මනසක් ලබා දේ.

අපගේ සුවිශේෂී විසඳුම් සමග ඔබගේ ගමන සතුටින් අත්විඳින්න.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
MOTORPLUS
යථාර්ථයට රක්ෂණයක්

LOYALTY REWARDS
මෝටර් ප්ලස් ලෝයල්ටි රිවෝර්ඩ්ස්

ප්‍රමුඛපෙළේ රථවාහන නියෝජිතයින් සමග සහසම්බන්ධතා

24/7
පැය 24 පුරා දීප ව්‍යාප්ත විශිෂ්ඨ සේවය

විශ්වාසය

SLIC
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
පියෙකු මෙන් මවක මෙන්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්
නො 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02
දුරකථන - 0112 357 000 ෆැක්ස් - 0112 447 742
Web - www.srilankainsurance.com

https://www.facebook.com/SLICorporation/
https://www.facebook.com/SLIMotorPlus/

**ක්ෂණික ඇමතුම් - 0112 357 357**



# කර්මාන්ත සංවර්ධන හා නවෝත්පාදන මධ්‍යස්ථානය

## Industrial Development and Innovation Centre (IDIC)

බස්නාහිර පළාත දිවයිනේ දියුණුතම කර්මාන්ත පුරවරයයි. කුඩා, මධ්‍ය හා මහා පරිමාණ කර්මාන්ත වැඩිම කර්මාන්ත ප්‍රමාණයක් සක්‍රියව පවතින පළාත මෙන්ම වැඩිම කර්මාන්ත නිෂ්පාදනයක් දැයට දායාද කරන්නේ ද බස්නාහිර පළාතයි' ගෝලීයකරණය ඇතුළු සීඝ්‍රයෙන් වෙනස්වන තාක්ෂණය" පාරිභෝගික අවශ්‍යතා" වෙළඳපොල තරගකාරීත්වය" අමුද්‍රව්‍ය හිඟය හා කාලගුණික වෙනස්වීම් හමුවේ දේශීය කර්මාන්ත හා කර්මාන්තකරුවා රැකගැනීමේ අවශ්‍යතාවය අන් කවරදාටත් වඩා ප්‍රමුඛ අරමුණක් වී ඇත' අනෙක් අතට විදෙස් වෙළඳපොල ඉලක්ක කරගත් නව නිෂ්පාදන දිරිමත් කිරීම මෙන්ම වඩා පිරිවැය කාර්‍යක්ෂම හා පරිසර හිතකාමී නිෂ්පාදන හා නිෂ්පාදන ක්‍රමවේද දිරිමත් කිරීම ද මූලික අවශ්‍යතා බවට පත්වී ඇත' එමගින් පළාතේ කර්මාන්තකරුවා රැකගනිමින් දිරිමත් කිරීමට මෙන්ම පළාතේ කර්මාන්ත නිෂ්පාදනය හා අපනයනය වර්ධනය කිරීම අප ඉදිරියේ ඇති වගකීමls'

### රාජ්‍ය-පුද්ගලික අංශවල සහයෝගීතාවය

මෙකී අරමුණු මුදුන්පමුණුවා ගැනීමේ පෙර දැක්මක් ඇතිව බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය හා වර්ධන සංකල්ප ආයතනය එක්ව පුද්ගලික-රාජ්‍ය අංශවල සහයෝගීතා ව්‍යාපෘතියක් ලෙස කර්මාන්ත සංවර්ධන හා නවෝත්පාදන මධ්‍යස්ථානය (Industrial Development and Innovation Centre) ස්ථාපිත කරන ලදී' කළුතර" කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්වල ක්ෂුද්‍ර මට්ටමේ මෙන්ම කුඩd" මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්ත සඳහා ද සේවා සැපයීම මෙම මධ්‍යස්ථානයේ කාර්යභාරය වී ඇත' මෙය වූ කලී බස්නාහිර පළාතේ කර්මාන්තකරුවන් වෙනුවෙන් සේවා සපයන ප්‍රධානතම ආයතනය ලෙස" පළාතේ සෑම පරිමාණයකම කර්මාන්ත වෙත තම සේවා පුළුල් කිරීමේ අරමුණ ඇතිව කර්මාන්ත සංවර්ධන අධිකාරිය තැබූ වර්ධනීය ඉදිරි පියවරකි' එසේම දිවයිනේ ප්‍රමුඛතම මහා පරිමාණ කර්මාන්ත හා ව්‍යාපාර ගණනාවකට දැනටමත් කළමනාකරණ හා නවෝත්පාදන සේවා සපයන පුද්ගලික ආයතනයක් ලෙස වර්ධන සංකල්ප ආයතනය ද තම විශේෂඥතාවය හා දායකත්වය ඊට එක්කර ඇත' එබැවින් මෙය පුද්ගලික-රාජ්‍ය සහයෝගීතාවh" සාමූහිකත්වය තුළින් කර්මාන්ත නවෝත්පාදනයේ විශිෂ්ටත්වය සාක්ශාත් කරගැනීමට දරණ උත්සාහයකි'

### අපගේ විශ්වාසය

විශේෂයෙන් දේශීය හා විදේශීය තාක්‍ෂණික ආයතන සමග සහයෝගීතා වැඩසටහන් ඔස්සේ නවෝත්පාදන දිරිමත් කිරීමත් කර්මාන්තකරුවන් හා තාක්‍ෂණ සේවා සැපයුම්කරුවන් අතර සහයෝගීතාවය වර්ධනය කිරීමත් මගින් කර්මාන්ත වර්ධනය වේගවත් කළ හැකිය යන විශ්වාසය මත මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක වෙhs'





wmf.a m%Odk wruqKq

- මධ්‍ය හා මහා පරිමාණ කර්මාන්තයන්හි නවෝත්පාදන අවශ්‍යතා හා අවස්ථා ඇගයීමට ලක් කිරීම හා ඒ පිළිබඳ කර්මාන්තකරුවන් දැනුවත් කිරීම.
- භාණ්ඩ හා සේවා නිෂ්පාදන නව්‍යකරණ සංකල්ප හඳුන්වා දීම, නව ආකෘති, අනුරූ හා මාදිළි නිර්මාණය කිරීම'
- කර්මාන්ත ඵලදායීතාවය ඉහළ නැංවීම හා පිරිවැය කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමේ ක්‍රමවේද පිළිබඳ පර්යේෂණ සිදුකිරීම හා අවශ්‍ය සේවා සැපයීu'
- කර්මාන්ත මෙවලම්, උපකරණ හා යන්ත්‍ර සූත්‍ර අලෙවිය හා අලෙවි සම්බන්ධතා ඇති කිරීම'
- කර්මාන්ත ප්‍රමිතිකරණය හා සහතික කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතා ඇතිකර ගැනීම'
- විදේශීය කර්මාන්ත හා කර්මාන්ත නවෝත්පාදන සේවා ආයතන සමග සහයෝගීතා වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම'
- විදේශීය සහයෝගීතා ආයතන සමග එක්ව කර්මාන්ත සංවර්ධනය හා නවෝත්පාදනය පාදක කරගත් නව ආයෝජන ප්‍රවර්ධනය කිරීම'
- මහා පරිමාණ කර්මාන්ත හා කුඩා කර්මාන්තකරුවන් අතර තාක්ෂණික හා ව්‍යාපාර සම්බන්ධතා ගොඩනැගීම'
- පරිසර හිතකාමී කර්මාන්ත නවෝත්පාදනය දිරිමත් කිරීම'
- හරිත ඵලදායීතාවය" හරිත රැකියා දායකත්වය හා සම්පත් සංරක්ෂණය පිළිබඳ කර්මාන්ත ආශ්‍රිත සේවකයින දැනුවත් කිරීම හා ඵලදායිතාවය ඉහළ නැංවීමේ ක්‍රම ක්‍රියාවට නැංවීu'

විමසීම්- කර්මාන්ත සංවර්ධන අධිකාරිය (බ.ප.)

සංකල්පය- ප්‍රසන්න සුජිත් කුමාර
සනත් විදානගමගේ



ඔබ බස්නාහිර පළාත ඇතුළත ව්‍යාපාර කටයුතු සිදුකරන ව්‍යාපාරිකයෙකුද? එසේත් නැතිනම් ඔබ අලුතින්ම කර්මාන්තයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන්නෙක්ද? එසේනම් අප අද උත්සාහ කරන්නේ ඔබ වෙනුවෙන් ඔබේ ව්‍යාපාරික අරමුණු  වෙනුවෙන් අතහිතදීමට කැමති තවත් එක් රාජ්‍ය ආයතනයක් වන "කර්මාන්තකරුවන්ගේ මහගෙදර" වශයෙන් හඳුන්වන බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ කාර්යභාරය පිළිබඳව ඔබව දැනුවත් කිරීමටයි. කර්මාන්තකරුවන්ගේ ආර්ථික හා සමාජීය ගුණාත්මකභාවය වැඩිදියුණු කරමින් බස්නාහිර පළාතේ ආර්ථිකයට ධනාත්මක දායකත්වයක් සැපයීමත්, පළාත තුළ කර්මාන්ත සංවර්ධනය හා ව්‍යාප්තිය වර්ධනය කිරීමත් අරමුණු කරගෙන ස්ථාපිත වූ මෙම ආයතනය පිළිබඳව අදහස් දක්වන්නට අප සමග එක්වුයේ ආයතනයේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක ප්‍රසන්න සුජිත් කුමාර මහතායි



# කර්මාන්තකරුවන්ට අතහිත දීම අපගේ අපේක්ෂාවයි

IDA අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක
**ප්‍රසන්න සුජිත් කුමාර**

### බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ආරම්භය පිළිබඳව කතා කරමු

බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය ආරම්භ වෙන්නෙ 1994 අංක 02 දරණ ප්‍රඥප්තියට අනුව. මේ ආයතනය ආරම්භ වනවිට එහි අරමුණ වී තිබුණේ පළාතේ කර්මාන්ත සංවර්ධනය, ප්‍රවර්ධනය, ව්‍යාප්තිය හා දිරිගැන්වීමයි.  වර්තමානයේ පළාත් කර්මාන්ත අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන්නේ ගරු ලලිත් වනිගරත්න මැතිතුමා වන අතර අමාත්‍යංශයේ ලේකම් වශයෙන් චම්පා එන්. පෙරේරා මහත්මිය කටයුතු කරයි. ඒ වගේම කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සභාපති වශයෙන් කටයුතු කරනු ලබන්නේ රෙහෙන්සිරි වරාගොඩ මැතිතුමායි.

### මේ ආයතනයේ කාර්යභාරය කොයිවගේද?

කර්මාන්ත සංවර්ධන අධිකාරියේ දැක්ම වෙලා තිබුණේ පළාතේ ප්‍රමුඛතම සේවා සම්පාදකයා වීමට. ඒ වගේම බස්නාහිර පළාතේ සිටින දැනට යම්කිසි කර්මාන්තයක් සිදුකරන හා සිදුකිරීමට අපේක්ෂා කරන පිරිසට අවශ්‍ය ව්‍යාපාරික පරිසරය නිර්මාණය කරදෙමින් ඔවුන්ට අවශ්‍ය කුසලතා සංවර්ධනය තාක්ෂණික දැනුම, මූල්‍ය පහසුකම්, වෙළඳපොල පහසුකම් සහ ඔවුන්ට අවශ්‍ය සියලුම සේවා අවශ්‍යතා පළාත් සභාවේ අරමුදල් මත සිදුකරමින් ඔවුන්ව කර්මාන්තකරුවන් කරමින් ඔවුන්ගේ ආදායම් තත්ත්වයන් ඉහළ මට්ටමකට ගෙනඑමින් රටේ ජාතික නිෂ්පාදිතය සඳහා දායකත්වය ලබාදීම හා ඔවුන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වුන පිරිසක් බවට පත්කිරීම තමයි අපේ මෙහෙවර බවට පත්වෙන්නේ.

## සේවාවන්

'' කර්මාන්තකරුවන්ගේ මහගෙදර ''යන නාමයෙන් හදුන්වන බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් කර්මාන්තකරුවන් විෂයෙහි සිදුකරනු ලබන සේවාව අතිවිශාලයි. විශේෂයෙන් මෙය ක්‍රියාත්මක වෙන්නේ සේවා මධ්‍යස්ථානයක් (Service Hub) ලෙස. මේ තුළ සේවාවන් රාශියක් ක්‍රියාත්මක වෙනවා.

## කර්මාන්තකරුවන් විෂයෙහි ප්‍රාග්ධනය සැපයීම

IDB ආයතනය, නාරා ආයතනය, නර්ඩ් ආයතනය, නැක්ඩා ආයතනය, ITI ආයතනය හා රජයේ අනෙකුත් තාක්ෂණික ආයතන අපත් සමඟ කටයුතු කරනවා. උදාහරණයක් විදිහට මෑතකදී කර්මාන්තකරුවකු විසින් ඉලෙක්ට්‍රික් ට්‍රක් එකක් නිර්මාණය කළා. එහිදී ඊට අවශ්‍ය නීත්‍යනුකූල මැදිහත්වීම සහ අනෙකුත් අවශ්‍යතා අප ඉහත කී ආයතන හරහා ඔහුට ලබාදුන්නා ඊට අමතරව තාක්ෂණික දැනුම ලබාදීමට අවශ්‍ය කර්මාන්ත ක්ෂේත්‍ර 33ක් තියෙනවා. ඒවාට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම අප විසින් සිදුකරනවා..

බස්නාහිර පළාත ඇතුළත, කර්මාන්තකරුවකුට කර්මාන්තයක් පවත්වාගෙනයාමට හා කර්මාන්තකරුවකු වීමට අපේක්ෂා කරන්නෙකුට කර්මාන්තයක් ආරම්භ කිරීමට ප්‍රාග්ධනය අත්‍යවශයයි. ඒ අවශ්‍යතා ඇති පුද්ගලයින්ට අපේ ආයතනය හරහා මූල්‍ය අතහිතදීම් ලබාදීමට අප කටයුතු කරනවා. මූලිකවම කර්මාන්තයක් අලුතින් ආරම්භ කරන්නෙකුට නම් ව්‍යාපෘති වාර්තාවේ සිටම අප ඔවුන් සමග කටයුතු කරනවා. සියලුම රාජ්‍ය සහ වෙනත් පෞද්ගලික මූල්‍ය ආයතනවලට මේ ව්‍යාපෘති වර්තා ඉදිරිපත් කරමින් ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකිරීමට අප කටයුතු කරනවා. ඒ වගේම මේ වනවිට ව්‍යාපාරයක් කරගෙන යන පුද්ගලයකු නම් ඔහුගේ හෝ ඇයගේ ව්‍යාපාර කටයුතු පිළිබඳව නිසි අධීක්ෂණයකින් පසුව වාර්තාවක් සකස්කර මූල්‍ය ආයතනයට ලබාදී ඔවුන්ගේ සේවා අවශ්‍යතා සැපිරීමට අප කටයුතු කරනවා. ගිය වසරේ අප මහබැංකුව සමග ද කටයුතු කරමින් එකී මූල්‍ය අවශ්‍යතා සැපිරීමට කටයුතු කළා. විශේෂයෙන්ම අඩු පොළී අනුපාතිකයන් යටතේ තමයි මේ ක්‍රියාවලිය සිදුකරන්නේ. ඒ නිසා ඕනෑම මට්ටමක සිටින කර්මාන්තකරුවකුට අපත් සමඟ කටයුතු කිරිමට හැකියාව තියෙනවා.

කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබාදීම අප විසින් සිදුකරනවා. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ අනෙකුත් ආයතනත් සමඟ බද්ධ වී තමයි අප මේ කටයුත්ත සිදුකරන්නේ. විශේෂයෙන් IDB ආයතනය, නාරා ආයතනය, නර්ඩ් ආයතනය, නැක්ඩා ආයතනය, ITI ආයතනය හා රජයේ අනෙකුත් තාක්ෂණික ආයතන අපත්



සමඟ කටයුතු කරනවා. උදාහරණයක් විදිහට මෑතකදී කර්මාන්තකරුවකු විසින් ඉලෙක්ට්‍රික් ට්‍රක් එකක් නිර්මාණය කළා. එහිදී ඊට අවශ්‍ය නීත්‍යනුකූල මැදිහත්වීම සහ අනෙකුත් අවශ්‍යතා අප ඉහත කී ආයතන හරහා ඔහුට ලබාදුන්නා. ඊට අමතරව තාක්ෂණික දැනුම ලබාදීමට අවශ්‍ය කර්මාන්ත ක්ෂේත්‍ර 33ක් තියෙනවා. ඒවාට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම අප විසින් සිදුකරනවා. ඒවගේම තාක්ෂණික දැනුම තවදුරටත් ලබාදීම සඳහා මේ වනවිට ග්‍රාම නිළධාරී කොට්ඨාශ මට්ටමෙන් ව්‍යාපෘතියක් අප ආරම්භ කරලා තියෙනවා. එහිදී එක් ග්‍රාම නිළධාරී කොට්ඨාශයකින් සුළු කර්මාන්තකරුවන් දස දෙනෙකු තෝරාගෙන තාක්ෂණික දැනුම හා පුහුණුවක් ලබාදීම සිදුකරනවා. එසේම ඔවුන්ට අවශ්‍ය සේවා සැපයීමට අදාළ ක්ෂේත්‍රයන් හා සම්බන්ධ විධිමත්, පුහුණු ක්ෂේත්‍රයේ ප්‍රවීන සම්පත්දායකයින් හරහා තමයි මේ කටයුත්ත සිදුකරන්නේ.

## නිසි වෙළඳපොල තත්ත්වයක් හඳුන්වාදීම

තම නිෂ්පාදන අළෙවි කරගැනීමට අපහසු කර්මාන්තකරුවන්ට ඔවුන්ගේ නිෂ්පාදන අළෙවි කරගැනීමට අවශ්‍ය වෙළඳපොලක් හඳුන්වාදීම අප විසින් සිදුකරනවා. ඒ සඳහා විවිධ ක්‍රියාමාර්ග අප විසින් ගනු ලබනවා. එහිදී සුළු කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමට මාසිකව ''සන්සල'' නමින් පොළක් පවත්වනවා. එය රාජ්‍ය ආයතනවල හා ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පවත්වන්නේ. ඊට අමතරව අනෙකුත් කර්මාන්තකරුවන්ට අවශ්‍ය දේශීය වෙළඳපලද අප හඳුන්වාදීමට කටයුතු කරනවා. ඒවගේම විදේශ වෙළඳපොලට තම නිෂ්පාදන හඳුන්වාදීමට අවශ්‍ය පරිසරය අප සකසා දෙනවා. එහිදී අදාළ ක්ෂේත්‍රයන් හා සම්බන්ධ අපනයනකරුවන් සමඟ කර්මාන්තකරුවන් සම්බන්ධ කිරීම හා කණ්ඩායම් වශයෙන් වෙළඳ ප්‍රදර්ශනය සඳහා සහභාගි කරවීම සිදුකරනවා. 2018 නොවැම්බර් මස 18, 19, 20 යන තෙදින තුළ ඩුබායි හි ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ පැවැත්වුනු ස්වභාවික කාබනික උපකරණ හා නිෂ්පාදන වෙළඳ ප්‍රදර්ශනය



සඳහා විවිධ මට්ටමේ කර්මාන්තකරුවන් 12 දෙනෙකු සහභාගි වුණා. ඔවුන්ගේ ක්ෂේත්‍රවලට අදාළ ඇනවුම් රාශියක් මැද පෙරදිග රටවලින් ලබාගැනීමට හැකිවීම ලොකු ජයග්‍රහණයක්.

## නිසි පුහුණු වැඩසටහන් පැවැත්වීම

විශේෂයෙන්ම ප්‍රාදේශීය මට්ටමින් ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් පැවැත්වීම අප විසින් සිදුකරනවා. ඒවගේම ආනයන අපනයන ක්‍රියාවලිය හා සම්බන්ධ පුහුණු වැඩසටහන්, භාණ්ඩ ඇසුරුම් ක්‍රම පිළිබඳ වැඩසටහන්. පරිගණක සාක්ෂරතා පුහුණු වැඩසටහන් අප මේ වනවිට අඛණ්ඩව පවත්වාගෙන යනවා.

> කාන්තා ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහා මැද කොළඹ හා කොළඹ කොටුව රොටරි සමාජය හා ඒකාබද්ධව මේ වනවිට අප ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින් යනවා. ඒ සඳහා එම රොටරි සමාජ දෙක විසින් මෑතකදී අපට රුපියල් මිලියනයක පරිත්‍යාගයක් සිදුකළා. මෙහිදී ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයේ හා ඇඟළුම් ක්ෂේත්‍රයේ කාන්තා ව්‍යවසායකයින් 25 දෙනකු සවිබල ගැන්වීමට කටයුතු කරනවා. එමගින් කාන්තාවන්ට ද නිෂ්පාදන ක්ෂේත්‍රයට දායක වී තමන්ගේ ගෘහස්ථ ආර්ථිකය ශක්තිමත් කරගැනීමට හැකිවෙනවා.

## විශේෂ විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම.

පළාතේ කර්මාන්තකරුවන්ගේ අනාගත සුරක්ෂිතතාවය උදෙසා ''දායකත්ව'' විශ්‍රාම වැටුප් ක්‍රමයක් මේ වනවිට හඳුන්වා දී තිබෙනවා. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයත් කර්මාන්ත සංවර්ධන අධිකාරියත් ඒකාබද්ධව තමයි මෙම වැඩපිළිවෙල පවත්වාගෙන යන්නේ. විශේෂයෙන් සුළු කර්මාන්තකරුවන්ට මෙය ඉතාම වැදගත් වෙනවා. ඔවුන්ට කර්මාන්තය පවත්වාගෙන යාමට නොහැකි කාලයේදී ඔවුන්ගේ දෙවැනි පරම්පරාව විසින් එම ව්‍යාපාරය නඩත්තු නොකරන්නේ නම්, එහිදී කර්මාන්තකරුවාට මේ විශ්‍රාම වැටුප් ක්‍රමය මත තම දරුවන්ටවත් බරක් නොවී ජීවත්වීමේ හැකියාව පවතිනවා. ඒ නිසා සුළු පරිමාණ කර්මාන්තකරුවන් මෙම දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකවීම ඉතා වැදගත් වෙනවා.

## කර්මාන්තකරුවන් ඇගයීම

පළාතේ කර්මාන්තකරුවන් ඇගයීමේ උළෙලක් 2019 වසරේ සිට පවත්වාගෙනයාමට අප කටයුතු සැලසුම් කර තියෙනවා. IDA Industry Leaders Award - 2019 හරහා ක්ෂුද්‍ර, සුළු සහ



මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ඇගයීමට ලක්කිරීම මෙහිදී සිදුවෙනවා. බස්නාහිර පළාත තුළ කර්මාන්තකරුවා සහ ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලිය මෙහිදී ඇගයීමට ලක්කෙරෙන අතර එහිදී ඇගයීමට භාජනය වීමට සුදුසුකම් නොලබන කර්මාන්තරුවන්ගේ අඩුපාඩුකම් හඳුනාගෙන නැවත එම අඩුපාඩුකම් සකසා ගැනීමට ඔවුන්ට උපදේශනය හා පුහුණුව ලබාදෙනවා. ඊට අමතරව බස්නාහිර පළාත තුළ ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීමත් මෙම උළෙලේ තවත් එක් අරමුණක් වී තිබෙනවා. කර්මාන්තකරුවන් ඇගයීමේ උළෙලේ අපගේ තේමාව වන්නේ "Empowering of Industrialist in Next Generation" යන්නයි.

## දේශිය හා විදේශීය ආයෝජකයන්ට අවශ්‍ය පහසුකම් සැලසීම

ලංකාව මේ වනවිට යුනිෆෝම් අවශ්‍යතා සඳහා මිලියන දහතුන්දහසක් පමණ ආනයනික වියදම් සඳහා වෙන්කරන අතර ඊට පිළියමක් වශයෙන් ලංකාවේ තිබෙන යුනිෆෝම් අවශ්‍යතාවයට සරිලන පරිදි මෙරට මුදල් විදේශයන්ට ගලාගෙනයාමට නොදී මෙරටම ඒ අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට අවශ්‍ය පහසුකම් ලබාගැනීමට විදේශ ආයොජකයන් හරහා අප කටයුතු කරලා තියෙනවා. දැනට ලංකාවේ සෞඛ්‍ය, ආරක්ෂක අංශ, බන්ධනාගාර යන ආයතනවල වාර්ෂික අවශ්‍යතාවය රෙදි යාර ලක්ෂ 32කි. ඒ සඳහා මේ වනවිට චීන ආයෝජකයෙකු අප සමග කටයුතු කරමින් සිටිනවා. ඒවගේම දේශීය කර්මාන්තකරුවන්ට ආයෝජනය කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම අප සිදුකරනවා.

## කර්මාන්තකරුවන්ව ප්‍රදර්ශන සඳහා යොමු කිරිම

මෙහිදී කර්මාන්ත ප්‍රදර්ශන සඳහා කර්මාන්තකරුවන්ව යොමු කිරීම සිදුවෙනවා. විශේෂයෙන් දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන්ද මේ යොමුකිරීම් සිදුකරනවා. එහිදී කර්මාන්තකරුවන්ට නව අවස්ථා නිර්මාණය වීමත්, නව ආයෝජකයන් මුණ ගැසීමත් සිදුවෙනවා. විශේෂයෙන්ම මෙම වසරේ නොවැම්බර් මස ඩුබායි හී පැවැත්වෙන නැචුරල් ඇන්ඩ් ඕර්ගනික් වෙළඳ ප්‍රදර්ශනයට කර්මාන්තකරුවන් සහභාගී කරවීමට අවශ්‍ය කටයුතු සිදු කර තිබෙනවා. තව ද ඉදිරි වර්ෂයේ දී චීනයේ කැන්ටර්




ෆෙයාර් වෙළඳ ප්‍රදර්ශනයටද පළාතේ කර්මාන්තකරුවන් සහභාගී කරවීමට බලාපොරොත්තු වෙනවා.

## කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම

කර්මාන්ත ගම්මානවලට අවශ්‍ය පුහුණුව, තාක්ෂණික දැනුම, යන්ත්‍ර සූත්‍ර හා වෙළඳපොල මට්ටම් හඳුන්වාදීම අප විසින් සිදුකරනවා. ඒ හරහා ලබන වසරේදී කළුතර දිස්ත්‍රික්කයේ කොහු ආශ්‍රිත නිෂ්පාදන ගම්මානයක් හා ගම්පහ දිස්ත්‍රික්කයේ කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන ගම්මානයක් සංවර්ධනය කිරීමට අප සැලසුම් කරලා තියෙනවා. ගම්පහ ප්‍රදේශයේ නිට්ටඹුව ප්‍රදේශයේ ගොරකදෙණිය ග්‍රාමයේ ස්වර්ණාභරණ නිෂ්පාදකවරුන්ගේ ගම්මානය අප අධිකාරියේ උපදෙස් හා සහාය ඇතිව ක්‍රියාත්මක වන ගම්මානයකි.

## කර්මාන්තකරුවන්ගේ දත්ත බැංකු සම්පාදනය

මෙහිදී අප කර්මාන්තකරුවන්ගේ දත්ත සටහන් කරගැනීම සිදුකරනවා. පළාතේ කර්මාන්තකරුවන්ගේ දත්ත බැංකුව මගින් ඔවුන්ගේ ගැටළු විසඳීමටත්, ඔවුන් වෙනුවෙන් රජය විසින් ගනුලබන ප්‍රතිපත්තිමය තීන්දු නිසියාකරව ගැනීමටත් මේ හරහා හැකියාව ලැබෙනවා. සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා තොරතුරු ලබාගනිමින් මේ කටයුත්ත සිදුකරනවා. විශේෂයෙන් ස්වභාවික ව්‍යසනයක් වැනි අවස්ථාවල දී මේ දත්ත බැංකු මගින් අදාළ ප්‍රදේශයේ විපතට පත් කර්මාන්තකරුවන් හඳුනාගෙන ඔවුනට නිසි පහසුකම් සැලසීමටද හැකියාව තියෙනවා. තවද කර්මාන්තකරුවන්ගේ සැබෑ අවශ්‍යතා හඳුනාගෙන නිරතුරුවම ඔවුන්ට අවශ්‍ය පිළියම් ලබාදීමටත් හැකියාව ලැබෙනවා.




## යන්ත්‍ර සූත්‍ර ලබාදීම

මෙහිදී පළාතේ කර්මාන්ත ආරම්භ කළ හා ආරම්භ කිරීමට බලාපොරොත්තුවෙන් සිටින කර්මාන්තකරුවන් සඳහා පළාත් සභා අරමුදල් මත ඔවුන්ගේ යන්ත්‍ර සූත්‍ර අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන අතර එහිදී කර්මාන්තකරුවන්ට තම නිෂ්පාදන කටයුතු නිසි අයුරින් පවත්වාගෙනයාමට හැකියාව පවතිනවා.

## කාන්තා ව්‍යවසායකයින් සවිබල ගැන්වීම

කාන්තා ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහා මැද කොළඹ හා කොළඹ කොටුව රොටරි සමාජය



හා ඒකාබද්ධව මේ වනවිට අප ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින් යනවා. ඒ සඳහා එම රොටරි සමාජ දෙක විසින් මෑතකදී අපට රුපියල් මිලියනයක පරිත්‍යාගයක් සිදුකළා. මෙහිදී ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයේ හා ඇඟළුම් ක්ෂේත්‍රයේ කාන්තා ව්‍යවසායකයින් 25 දෙනකු සවිබල ගැන්වීමට කටයුතු කරනවා. එමඟින් කාන්තාවන්ට ද නිෂ්පාදන ක්ෂේත්‍රයට දායක වී තමන්ගේ ගෘහස්ථ ආර්ථිකය ශක්තිමත් කරගැනීමට හැකිවෙනවා. මෙම වැඩසටහන ඉහත කී රොටරි සමාජ දෙක හා කර්මාන්ත සංවර්ධන අධිකාරිය නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කර ඇති අතර ඉදිරියේ දී අඛණ්ඩව කරගෙන යාමටද එකඟතාවයකට පැමිණ සිටිනවා.

## තාක්ෂණික හා නවෝත්පාදන විසඳුම් (Technical & Innovation Solution)

කර්මාන්ත සංවර්ධන අධිකාරිය මඟින් පළාතේ මධ්‍ය හා මහා පරිමාණ කර්මාන්ත සඳහා අවශ්‍ය වන තාක්ෂණික හා නවෝත්පාදන විසඳුම් ලබාදීම සිදුකරන අතර ඒ සඳහා දැනට ''IDIC ''(Industrial Development and Innovation Center) නමින් විශේෂ ඒකකයක් ස්ථාපිත කර ඇත. මෙහිදී කර්මාන්තකරුවන්ට කර්මාන්ත සම්බන්ධයෙන් පැන නඟින සෑම ගැටලුවකටම නිසි පිළියම් ලබාදීමට කටයුතු කරන අතර එමඟින් ඔවුන්ගේ කර්මාන්තවල නිෂ්පාදනය, ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ යනවා.

### කුඩා කර්මාන්තකරුවන් ගොඩනැගීමේ විශේෂ වැඩපිළිවෙලක් කර්මාන්ත සංවර්ධන අධිකාරියට තිබේද?

සත්‍ය වශයෙන්ම ඔව්. දැනට කර්මාන්ත සංවර්ධන අධිකාරිය සහ ජනාධිපති ලේකම් කාර්යාලය සමග එක්ව මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතු ආරම්භ කරමින් සිටිනවා. මෙහිදී ක්ෂේත්‍ර 14ක් මගින් සුළු කර්මාන්තකරුවන් 1000ක් ගොඩනැගීම හා සංවර්ධනය කිරීමට අපේක්ෂා කරනවා. මෙම ව්‍යාපෘතිය සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ අනුමැතියද ලබාගෙන ඇති අතර ජනාධිපති ලේකම් කාර්යාලයේ නිලධාරීන් සමග සාකච්ඡා පවත්වමින් එම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ කටයුතු මේ වනවිට සිදු කෙරෙමින් පවතිනවා. මෙම වැඩසටහන අතිගරු ජනාධිපතිතුමාගේ දිළිඳුකම පිටුදැකීමේ උපායමාර්ගික

> මෙම වැඩසටහන රොටරි සමාජ දෙක හා කර්මාන්ත සංවර්ධන අධිකාරිය නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කර ඇති අතර ඉදිරියේ දී අඛණ්ඩව කරගෙන යාමට ද රොටරි සමාජ දෙක හා කර්මාන්ත සංවර්ධන අධිකාරිය එකඟතාවයකට පැමිණ සිටිනවා.

වැඩසටහනටද රුකුලක් වනබවට අපට විශ්වාසයි.

### ඔබ ආයතනය හරහා නව නිපැයුම්කරුවන්ට දායකත්වයක් ලබාදෙනවාද?

මෙහිදී අප නව නිපැයුම්කරුවන්ගේ කොමිෂමත් සමග ඒකාබද්ධ වී කටයුතු කරනවා. නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය පේටන්ට් බලපත්‍ර ලබාදීම සිදුවුවද ඔවුන් සොයාගත් දේ ඉදිරියට රැගෙන යාමට ඔවුන්ට අතහිතදීමක් සිදුවීම අවමයි. ඒ නිසා ඔවුන්ගේ නිර්මාණයන් ඵලදායී ලෙස ඉදිරියට කරගෙනයාමට අප ඔවුන්ට අවශ්‍ය සහයෝගය ලබාදෙනවා.

### විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් කර්මාන්ත අංශයෙන් සවිබල ගැන්වීම සිදුවන්නේ කොහොමද?

පෞද්ගලික අංශයත් සමග ඒකාබද්ධ වෙමින් තමයි විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්ට අප උදව් කරන්නේ. එහිදී ඔවුන්ට අවශ්‍ය දැනුම, උපකරණ ලබාදීම වැනි අවශ්‍යතා ඉටුකරනවා. අපට ඉල්ලීම් ලැබෙන ආකාරයට තමයි මේ කටයුත්ත සිදුකරන්නේ.

### 2010 වර්ෂයේ ස්ථාපිත වූ උපදේශන කාර්යංශය හරහා සිදුවන්නේ කොයිවගේ කාර්යභාරයක්ද?

උපදේශන කාර්යංශය හරහා කර්මාන්තකරුවන්ට අවශ්‍ය නිසි උපදේශන ලබාදීම සිදුවෙනවා. එහිදී අදාළ ක්ෂේත්‍රයට ගැළපෙන ආකාරයෙන් විශේෂඥ දැනුම සහිත සම්පත්දායකයින් තමයි මේ උපදේශනයන් සිදුකරන්නේ. කර්මාන්තකරුවන්ගේ සියලුම ගැටලු සඳහා මේ උපදේශන කාර්යංශය මගින් විසඳුම් ලබාදීමට කටයුතු කරනවා.

### යම්කිසි ආකාරයකින් සුළු පරිමාණ කර්මාන්තකරුවකුගේ ව්‍යාපාරය අතරමගදී ඇනහිටීමක් සිදුවුවහොත් ඔවුන් නගා සිටුවීමට මේ ආයතනය ලබාදෙන දායකත්වය කොයිවගේද?

සාමාන්‍යයෙන් අපේ ආයතනයත් සමග මුල සිටම වැඩකරන ව්‍යාපාරිකයකු නම් ඔහුගේ ව්‍යාපාරය කඩාගෙන වැටීමට ඇති ප්‍රවණතාවය අඩුයි. මොකද, අප මුල පටන්ම ඔවුන්ගේ මානසිකත්වය ව්‍යාපාරයට ගැළපෙන ආකාරයට සකස් කරලා තියෙන්නේ. ඒවගේම සරල කළමනාකරණ ක්‍රම හඳුන්වාදීමත් ව්‍යාපාරික තත්ත්වයන් අධීක්ෂණය හා පසුවිපරම් කිරීමත් අප විසින් සිදුකරනවා. නමුත් යම් පුද්ගලයකුගේ ව්‍යාපාරයක් අතරමගදී නැවතුනහොත් මුල පටන්ම ඔහුගේ මානසිකත්වය සකස්කිරීමත්, ව්‍යාපාරය කළමනාකරණය කරගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීමත්, නැවත පුහුණුව ලබාදීමත් මගින් ව්‍යාපාරය දියුණු කරගැනීමට දායකත්වය ලබාදෙනවා.

### කර්මාන්තකරුවකු වීමට අපේක්ෂා කරන්නෙකුට දියහැකි පණිවුඩය මොකක්ද

කර්මාන්තයක් ආරම්භ කිරීමට බලාපොරොත්තුවන ඕනෑම ව්‍යවසායකයෙකුට ඊට අදළ ක්ෂේත්‍ර විශාල ප්‍රමාණයක් තියෙනවා. දැනුම තියෙනවා. තාක්ෂණය තියෙනවා. උපදෙස් ගැනීමට ආයතන තියෙනවා. සමහරවිට තමන්ට වෙනත් රජයේ හෝ පෞද්ගලික අංශයේ රැකියාවක් කිරීමට සුදුසුකම් මදි වන්නට පුළුවන්. නමුත් කුමන හෝ ක්ෂේත්‍රයක කර්මාන්තයක් ආරම්භ කිරීම තුළින් තමන්ට ආර්ථික වශයෙන් ශක්තිමත්වීමට අවස්ථාව තියෙනවා කියලා අමතක කරන්න එපා. ඒ නිසා, ඇවිත් මේ අවස්ථාවලින් උපරිම ප්‍රයෝජන ගන්න කියලා අප ආරාධනා කරනවා.

විමසීම් :

ලිපිනය : අංක 4-A,1/1 සෝරත මාවත,

(විජේරාම හන්දිය)

ගංගොඩවිල, නුගේගොඩ

දුරකථන: 011 2804500

වෙබ් අඩවිය : www.ida.wp.gov.lk



සාකච්ඡා කළේ

**Iresha Sandagiri**

B.A. (Mass Communication) Sp.

# DUBAI EXPO2018 8







## ප්‍රදර්ශනයෙන් කර්මාන්තකරුවන්ට වාසි රැසක්




පසුගිය නොවැම්බර් මස තෙදිනක් පුරා ඩුබායි හි ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ රටවල් ගණනාවක සහභාගිත්වයෙන් පැවති එක්ස්පෝ 2018 ප්‍රදර්ශනයට කර්මාන්තකරුවන් 12 දෙනෙකු සහභාගි කරවීමට කර්මාන්ත සංවර්ධන අධිකාරිය සමත්විය. කාබනික හා ස්වාභාවික නිෂ්පාදන වලට ප්‍රමුඛත්වය දුන් නිෂ්පාදන වලට මැද පෙරදිග රටවලින් ඇනවුම් රැසක් ලබාගැනීමට අපේ කර්මාන්තකරුවෝ අවස්ථාව උදාකරගත්හ.

කර්මාන්ත සංවර්ධන අධිකාරි නියෝජනය කරමින් වැඩබලන පරිපාලන නිලධාරී චතුරි බ්‍රාහ්මණ මහත්මිය ද එයට සහභාගි විය.

*මාගේ උණුසුම් සුබ පැතුම්...*

**දයානන්ද හපුතන්ත්‍රී**

## උත්සව සිරියෙන් දොරට වැඩුම



කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සේවා පැතිකඩ එළිදක්වීම හා වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම කොල්ලුපිටියේ රේණුකා හෝටල් පරිශ්‍රයේදී සිදුකෙරිණි. එම අවස්ථාවට සහභාගි වූ බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාර කේ සී ලෝගේෂ්වරන්, පළාත් අමාත්‍ය ලලිත් වනිගරත්න, පළාත් අමාත්‍ය රංජිත් සෝමවංශ හා මන්ත්‍රී සුමිත් ලාලා මෙන්ඩිස් යන මහත්වරුන්




## ඩුබායි ප්‍රදර්ශනයට පෙර

ඩුබායි ප්‍රදර්ශනය සඳහා සහභාගි වන කර්මාන්තකරුවන්ගේ හමුවක් පසුගියද කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. එයට සහභාගි වූ සභාපති, අධ්‍යක්ෂ ඇතුලු මහත්වරුන් වෙත කර්මාන්ත කරුවෙක් අදහස් දක්වූ අයුරු.

## පාවහන් නිෂ්පාදන පුහුණු වැඩමුළුවක්

තාක්ෂණික හුවමාරු වැඩසටහන් යටතේ පාවහන් නිෂ්පාදනය කරන කාන්තාවන් සඳහා පුහුණු වැඩසටහනක් පසුගිය ද කර්මාන්ත සංවර්ධන අධිකාරි පරිශ්‍රයේදී පැවැත්විණි. වැඩසටහන ආරම්භ කරමින් සංවර්ධන නිලධාරී තරංග බමුණුසිංහ මහතා එහි ස්වභාවය ඊට සහභාගීවූවන්ට පැහැදිලි කරදුන් අයුරු.




## IDIC ආයතනය පිහිටුවීම



කර්මාන්ත සංවර්ධන අධිකාරිය IDIC ආයතනය පිහිටුවීම පසුගියද සිදුකෙරිණි. එහි ගිවිසුම් පිටපත විධායක අධ්‍යක්ෂ සුජිත් කුමාර මහතා වෙත පිරිනමනු ලැබීය.

## කාන්තාවන්ට ඇඳුම් මැසීමේ පුහුණු වැඩමුළුවක්



තාක්ෂණික හුවමාරු වැඩසටහන් යටතේ කාන්තාවන් සඳහා ඇඳුම් මැසීමේ පාඨමාලාවක් පසුගිය ද කර්මාන්ත සංවර්ධන අධිකාරි පරිශ්‍රයේදී පැවැත්විණි. එහි උපදේශිකා චන්ද්‍රලතා ඉඹුලාන මහත්මිය සිය කාර්යයේ නිරතවෙමින්.

# සේයාරූ සටහන්

## රොටරි සමාජයෙන් පරිත්‍යාගයක්







බස්නාහිර පළාතේ කර්මාන්තකරුවන් සවිබල ගැන්වීමට ආරම්භ කළ ජීවන දිරියට සවිය නියමු ව්‍යාපෘතිය සඳහා මැද කොළඹ හා කොළඹ කොටුව රොටරි සමාජය විසින් රුපියල් දසලක්ෂයක මුදලක් පසුගියද පරිත්‍යාග කළේය. පූජ්‍ය බඳගිරියේ සෝමවංශ හිමි, අමාත්‍ය ලලිත් වනිගරත්න මහතා, කොටුව හා මැදකොළඹ රොටරි සමාජයේ සභාපතිවරුන් සමඟ මහාචාර්ය චන්දන ජයරත්න මතාතාද එම අවස්ථාවට සහභාගි විය.

## මිනි ට්‍රක් රථය පාරිභෝගිකයන්ට හඳුන්වාදීම



කර්මාන්ත සංවර්ධන අධිකාරිය හා ටොරෙන්ටෝ ආයතනය එක්ව නිපදවන ලද විදුලි බලයෙන් ධාවනය කළ හැකි මිනි ට්‍රක් රථය පාරිභෝගිකයන්ට හඳුන්වාදීම පසුගියද බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී සිදුකරන ලදී.

## ඇසුරුම්කරණය පාඨමාලාව අවසන්කොට...



කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් මෙහෙයවන ලද ඇසුරුම්කරණය පාඨමාලාව පසුගියද කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. එයට සහභාගිවූ කර්මාන්තකරුවෙක් තමන්ට හිමි සහතික පත්‍රය ගරු සභාපති රෙහෙන්සිරි වරාගොඩ මහතා අතින් ලබාගත් අවස්ථාව.

## බිම්මල් වගා පුහුණු පාඨමාලාවක්

තාක්ෂණික පුහුණු වැඩසටහන් යටතේ බිම්මල් වගාව පිළිබඳ පාඨමාලාවක් පසුගිය ද ශ්‍රී ලංකා අපනයන මණ්ඩලයට අනුබද්ධ බිම්මල් පුහුණු කිරීමේ පෞද්ගලික මධ්‍යස්ථානයේ දී සිදුකෙරුනි. එහි උපදේශකවරයෙකු අදළ විස්තර ප්‍රායෝගිකව පෙන්වාදුන් අයුරු.



# ශ්‍රී ලංකාවේ අපනයන ක්‍රියාපටිපාටිය




**සරළ පහසු කාර්යයක් සේ පෙණුනද භාණ්ඩ අපනයනය යනු ඉතා සංකීර්ණ ක්‍රියාවලියකි. අපගේ නිෂ්පාදන භාණ්ඩ, ජීව අජීව වස්තූන් තවත් රටකට ඇතුල්වීමට පෙර ඔවුන් ඒවා මනාකොට පරීක්ෂාවට ලක්කරයි. එයට අවශ්‍ය තත්ත්වය, ප්‍රමිතිය, කාර්යක්ෂමතාව, ශක්‍යතාව වැනි දේ පිළිබඳ නිවැරදි සහතික ඉදිරිපත් නොකිරීම, භාණ්ඩ තොගයම නැවත හරවා එවීමට හේතුවක් විය හැකිය.**
**මේ ලිපියෙන් පෙන්වාදෙන්නේ භාණ්ඩ අපනයනකරුවකු නියත වශයෙන්ම පිළිපැදිය යුතු පිළිවෙත් හා ක්‍රියාකාරකම් පිළිබඳ කෙටි පැහැදිළි කිරීමකි.**

අපනයන කාර්යයේ යෙදීමට බලාපොරොත්තු වන අයෙකු

- **අපනයනය කිරීම සඳහා භාණ්ඩ-**
- **විදේශීය ගැණුම්කරුවෙකු සොයා ගැනීම-**
- **අපනයනය සඳහා මුදල් -**

යන මූලික සාධක 3 සම්පූර්ණ කළ යුතුය. භාණ්ඩ අපනයනය කිරීමේදී වෙන්දේසි වලින් හා නියෝජිතයන් මාර්ගයෙන් ගෙන අපනයන කාර්යයේ නිරත විය හැකි අතර එහිදී භාණ්ඩ ප්‍රමිතිය හා ඇසුරුම් කිරීම පිළිබඳ සැලකිලිමත් විය යුතුය. අපනයනය සඳහා විදේශීය ගැණුම්කරුවෙකු සොයා ගැනීමේදී ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙළඳ තොරතුරු සේවා අංශයෙන් හා වෙළඳ මණ්ඩල තානාපති කාර්යාල ආදියෙන් තොරතුරු ලබාගත හැක. එසේම මීට මුදල් යෙදවීම තම අරමුදලින් හෝ වාණිජ බැංකු හරහා ණය පහසුකම් ලබාගත හැකිය.

**පහත ආයතන තුළ අපනයන කරුවන් ලියාපදිංචි විය යුතුය.**

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB)
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

මීට අමතරව භාණ්ඩ අනුව ලියාපදිංචි වීමේදී අද නිෂ්පාදන ආයතනයන්හි නීති හා රෙගුලාසි වලට යටත්වීමෙන් ලියාපදිංචිය සිදුකරගත හැකිය.

**අපනයනය සඳහා අවසර ගතයුතු භාණ්ඩ**

ඇතැම් භාණ්ඩ වාණිජමය පදනමක් මත අපනයනය කිරීම සඳහා ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. එහිදී පාලනාධිකාරියේ නිර්දේශ මත අදාළ භාණ්ඩය සඳහා අනුමැතිය ලබාදේ. පහත භාණ්ඩ අපනයනය කිරීමට අදාළව අනුමැතිය ගතයුතු ආයතන මෙසේය.

- කොරල් සහ හක් බෙල්ලන් - **ධීවර දෙපාර්තමේන්තුව**
- ඇත්දළ හා ඇත්දළ නිෂ්පාදන **වනජීවී දෙපාර්තමේන්තුව** (දැනට මෙම භාණ්ඩ අපනයනය තහනම් කර ඇත) 1945.01.01. පෙර ලියාපදිංචි
- මෝටර් රථ - **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

**අපනයනය සඳහා තහනම් භාණ්ඩ**

- පණ ඇති හෝ මියගිය වන සතුන් සහ කොටස් (හම්,

දළ, අං තට්ටු, පිහාටු, සත්ත්ව ඇට, බිත්තර)

- පුරාවස්තු සහ සංස්කෘතික දේපළ
- මත් ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන හා ආශ්‍රිත පැලෑටි
- පුපුරණ ද්‍රව්‍ය හා අවි ආයුධ
- ලංකාවට ආවේනික හා වඳවීමේ තර්ජනයට ලක්ව ඇති මිරිදිය මසුන්
- ස්වභාවික වාණිජ ද්‍රව්‍ය
- අසභ්‍ය පොත්පත්, සඟරා, ලිපිලේඛන, CD
- ලංකාවට ආවේනික පැලෑටි, අතු රිකිල, බීජ, ජලජ ශාක

අපනයනකරුවෙකු හැම විටම තම මිල ගණන් ආයනයනකරු වෙත දැක්විය යුත්තේ ඇමෙරිකන් ඩොලර් , පවුම්, යුරෝ ආදී ප්‍රධාන රටවල මුදල් වලිනි. අපනයනකරු හා ආනයනකරු අතර ඇති වන වෙළඳ ගිවිසුම මත භාණ්ඩ සඳහා මුදල් ගෙවීම තීරණය වන අතර, භාණ්ඩ නැව්ගත කිරීමට පෙර මුදල් ගෙවීමේ ක්‍රමය, ණයවර ලිපි, අවලංගු කළ නොහැකි ණයවර ලිපි, අවලංගු කළ නොහැකි ස්ථිර ණයවර ලිපි යනාදී ගෙවීම් ක්‍රම මත මුදල් ගෙවීම කළ හැකිය.

සමහර ගෙවීම් ක්‍රම වල ඇති අවදානම් තත්වය මඟහරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණය ඇති බැවින් ඒ පිළිබඳව වැඩි විස්තර අපනයන ණය රක්ෂණ සංස්ථාවෙන් ලබාගත හැකිය.

ගුවන් මගින් භාණ්ඩ යැවීමේදී අපනයනකරු ගුවන් නැව් ඒජන්ත හෝ ඔවුන්ගේ නියෝජිතයන් මඟින් ඉඩපහසුකම් සලසාගත යුතුය. මෙහිදී ආරක්ෂක හේතූන් මත ගුවන්යානයට භාණ්ඩ පැටවීමට පෙර භාණ්ඩ තොගය ගුවන්තොටුපල වෙත යැවිය යුතුය.

- සාමාන්‍ය භාණ්ඩ - පැය 7කට පෙර
- එළවළු පළතුරු කැපූ මල් සහ පත්‍ර - පැය 5කට පෙර
- ජීවී මසුන් - පැය 4කට පෙර
- පණ ඇති සතුන් - පැය 2කට පෙර
- කුරියර් සාම්පල් පැය 4 කට පෙර

නැව් මගින් භාණ්ඩ යැවීමේදී භාණ්ඩ නැව්ගත කිරීමට නාවික ඉඩ පහසුකම් සොයා බැලිය යුතු අතර භාණ්ඩ පැටවීමට පෙර භාණ්ඩ තොගය වරායට යැවිය යුතුය. නැව්ගත කිරීමේදී රේගු නිලධාරීන්ට පහසුවෙන් පරීක්ෂා කළ හැකි පරිදි භාණ්ඩ පොදි සකස් කළ යුතුය. ආනයනකරුගේ අවශ්‍යතාවය අනුව හෝ ණයවර ලිපියේ කොන්දේසි අනුව භාණ්ඩ සකසා තිබිය යුතුය. සියළුම භාණ්ඩ පොදිවල ඒවා හඳුනාගතහැකි පරිදි සලකුණු, ගමනාන්ත වරාය සඳහන් කළ යුතුය.



නැව්ගත කිරීම සඳහා වරායට ප්‍රවාහනය කිරීමට පෙර රේගු දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු අතර, එහිදී අපනයනකරු "අපනයන සටහන්කරයක්" පිටපත් 4 ක් සම්පූර්ණ කර රේගුවේ අපනයන අංශයට භාරදිය යුතුය. මෙම අපනයන සටහන්කරය සම්පූර්ණ කරන අයුරු පිළිබඳ උපදෙස් පත්‍රිකාවක් රේගු ප්‍රකාශන කවුන්ටරයෙන් ලබාගත හැකිය. එසේම අපනයනකරු තම භාණ්ඩ වරාය තුළට ගෙන ඒමට පෙර නැව්ගත කිරීමේ ලියකියවිලි සකසාගත යුතුය.

අපනයනකරු භාණ්ඩ නැව්ගත කිරීමට පෙර වරාය ගාස්තු ගෙවිය යුතුය. මේ සඳහා ඔහු SN පෝරමය (නාවික සටහන් පත්‍රය) පිටපත් 3 ක් සම්පූර්ණ කොට වරායේ මුදල් අංශයට ගෙවිය යුතුය. එහිදී මුදල් අංශය වරාය ගාස්තු අය කරගත් බව සහතික කර ඉන් පෝරම දෙකක් නැවත අපනයනකරු වෙත භාරදෙයි.

**අපනයනය සඳහා අවශ්‍ය විවිධ සහතික හා ලිපි ලේඛණ**

- වාණිජ ඉන්වොයිසිය
- ඇසුරුම් ලේඛණය
- නැව්භාර පත්‍රය
- ගුවන්මාර්ග බිල්පත (ගුවන් මගින් අපනයනය කරයි නම්)
- නාවික රක්ෂණ සහතිකය
- ප්‍රභවස්ථාන සහතික (GSP, CO, BOI Enterprises)
- තානාපති ඉන්වොයිසිය (මැද පෙරදිග හෝ ලතින් ඇමරිකානු රටවලට භාණ්ඩ අපනයනය කිරීමේදී)
- පැලෑටි නිරෝධායන සහතිකය
- ධූමායන සහතිකය
- සෞඛ්‍ය සහතිකය
- ජල ප්‍රමිතිය පිළිබඳ සහතිකය
- ප්‍රමිති සහතිකය
- කාබනික සහතිකය
- පරීක්ෂණ වාර්ථා සහතිකය

සියලුම සහතික පිළිබඳව සෑහීමකට පත්වීමෙන් අනතුරුව භාණ්ඩ නැව්ගත කිරීමට අවසර ලබා දේ. භාණ්ඩ නැව්ගත කිරීමෙන් පසු ඉහත අපනයන ලියවිලි තම වාණිජ බැංකුව මගින් විදේශ ගැණුම්කරුවා වෙත ලැබීමට සලස්වයි.

**Wasantha Manthripala**
*(Visiting Lecturer
Sri Lanka Open University and
Sri Jayawardenepura)*

සමුපකාර රන් සම්මානයෙන් පිදුම් ලත්

# සීමාසහිත
# ව්‍යාපාර සංවර්ධන සමුපකාර සමිතිය

(බස්නාහිර පළාත)

**අපගේ සේවාවන්- මූල්‍ය පහසුකම්, මූල්‍ය නොවන පහසුකම් සුභ සාධනය, වෙනත් ව්‍යාපෘති**

- ව්‍යාපාරික ණය
- ස්ථිර තැන්පත් ඇප මත ණය
- අයිරා ණය
- උත්සව ණය
- භාණ්ඩ ණය
- රාජ්‍ය සේවක ණය
- දේපළ ඇප මත ණය
- ප්‍රණාම ණය
- කාර්ය මණ්ඩල ණය
- පොදු පහසුකම් ණය
- සංචාරක ණය
- අධ්‍යාපනික ණය
- ආපදා ණය
- උකස් ණය
- සහන ණය
- කර්මාන්ත සංවර්ධන ණය
- සූර්ය බලශක්ති උත්පාදක ණය

ප්‍රධාන කාර්යාලය
**රාමවික්‍රම සමුපකාර මන්දිරය**
615, අවිස්සාවේල්ල පාර, මුල්ලේරියාව නව නගරය
දුරකථන. 0112 569806, 0112 569944, 0112 410900
ෆැක්ස්. 0112 157100, 0112 157111
Email: coopbank@sltnet.lk bdcoopbank@gmail.com
Web: www.coopbank.lk

මාගේ උණුසුම් සුබ පැතුම්...

## මහින්දසිරි ලී වෙළෙඳසැල

**පාසල් ඩෙස්ක් පුටු සපයන්නෝ**

12/5 සුහසාධන මාවත, එගොඩඋයන, මොරටුව
ටෙලි. 0714 806641

With Best Compliments from

STC

## Sri lanka State Trading (General) Corporation

No: 100, Nawam Mawatha ,Colombo 02
(P.O Box. 1686)
Tel: 011-2422341 / 011-2440880
E-mail: lankagen@sltnet.lk
Visit – www.stcgeneral.com

Importers and Distributors of Household, Electrical & Electronic, Agricultural, Office Equipment & Stationery, Machinery & Tools, Computers and IT related equipments


වැඩි ආදායමක්..විශ්වාසවන්ත ගමනක්..
meter වෙතින්
නොමිලේ ලබාදෙන LED පැනලය සමඟ
මීටරයක සාඩම්බර හිමිකරුවකු වන්න
ELECTRONIC TAXI FARE METER
TAXI
මීටරයට - මීටරයක්
SERANDIB
TECHNOLOGIES ASIA (PVT) LTD.
අමතන්න :
0112 634 222
076 313 4812
0777 415 416
0767 415 416
www.serandibtechnologies.com


බස්නාහිර පළාත්
කෘෂි සේවා අධිකාරියෙන්
හෙළ බොජුන්
නීරෝගිමත් පරපුරක් උදෙසා පාන් පිටි,
රසකාරක වලින්, වසවිසෙන් තොර
දේශීය රටාවකින් යුත්
පිරිසිදු ආහාර වේලක් රස විඳීමට
සහ
කෘෂි උපකරණ මිලදී ගැනීමට
බස්නාහිර පළාත්
කෘෂි සේවා අධිකාරිය
375H, මාකුඹුර, පන්නිපිටිය
දුරකථන. 0112 855859, 0711 518858
ෆැක්ස්. 0112 855969
www.agrosawp@gmail.com




# Southern Machine

No: 151/10, High Level Road, Godagama, Homagama

Tel: **0112 748908**


*මාගේ උණුසුම් සුබ පැතුම්...*

## සම්පත් කුමාරගේ

**කළමනාකරණ මණ්ඩල සාමාජික**
**කර්මාන්ත සංවර්ධන අධිකාරිය**